පිටුව


1. හැඳින්වීම 02

2. දැක්ම 03

3. මෙහෙවර 04

4. සභාපති ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩලය 05

5. ප්‍රධාන නිලධාරි මණ්ඩලය 06

6. සංවිධාන ව්‍යුහය 07

7. සභාපතිතුමාගේ සමාලෝචනය 08-09

8. අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාව 10-11

9. විගණන කළමනාකරණ කමිටු වාර්තාව 12

10. ක්‍රියාත්මක වන වැඩසටහන් 13-39

11. මූල්‍ය ප්‍රකාශන 40-47

   a. මූල්‍ය තත්ත්ව ප්‍රකාශය
   b. ආදායම් හා වියදම් ගිණුම
   c. මුදල් ප්‍රවාහ ප්‍රකාශය
   d. ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය

12. රජයේ විගණන වාර්තාව 48-55

# හැඳින්වීම

## නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය

නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය පිහිටුවන ලද්දේ

2008 අංක 36 දරණ

නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය

පනත මඟිනි.

නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය පිහිටුවීමේ මූලික අරමුණ වූයේ නාගරික ජනාවාස සංවර්ධනයට අදාල ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීම, තිරසර නාගරික ජනාවාස සංවර්ධනයක් ඇතිවනු පිණිස අඩු පහසුකම් නාගරික ජනාවාසවල වෙසෙන ජනතාවගේ ජීවන තත්වය නඟා සිටුවීම හා එම ජනතාවට අවම නාගරික පහසුකම් සඳහා ප්‍රවේශය සලස්වමින් දැනට පවතින නිවාස ඒකක වැඩිදියුණු කිරීම හෝ වඩාත් යහපත් නිවාස පහසුකම් ලබාදීම සඳහා වැඩසටහන් සම්පාදනය කර ක්‍රියාත්මක කිරීම සඳහාත්ය.

# දැක්ම

“තිරසර නාගරික ජනාවාස තුළ උසස් ජීවන රටාවක් සහතික කිරීම..........”





# මෙහෙවර

"සාකල්‍ය නාගරික සංවර්ධන සැලැස්මකට අනුගතව

උගණ පහසුකම් සහිත නාගරික ජනාවාසවල සහ

නාගරික කලාපවල වැසියන්ගේ

නිවාස ගැටළුවට විසඳුම් ලබාදීම හා

ඒ හා සමගාමීව

ඔවුන් සමාජ, ආර්ථික හා සංස්කෘතික වශයෙන්

සවිබල ගැන්වීම"

# 2014

## 2014.01.01 දින සිට 2014.12.31 දක්වා අධ්‍යක්‍ෂ මණ්ඩලය

| අනු අංක | තනතුර | නම | පත්වූ දිනය |
|---|---|---|---|
| 1 | සභාපති | නීතිඥ පාලිත ගමගේ මහතා | 2010.05.24 |
| 2 | අධ්‍යක්ෂ ජනරාල් (අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්) | වෛද්‍ය සුමිත් වන්නිආරච්චි මහතා | 2010.05.26 |
| 3 | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | පූජ්‍ය ඉත්තෑකන්දේ සද්ධාතිස්ස හිමි | 2010.05.24 |
| 4 | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | ඩබ්.එම්.පී.පී. වික්‍රමසිංහ මහතා | 2012.01.05 |
| 5 | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | ඒ.එම්.වීරසේන මහතා | 2013.08.16 |
| 6 | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | ඒ.ඩබ්.දයානන්ද මහතා | 2010.07.07 |
| 7 | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | ටී.එම්.ජේ.බණ්ඩාර මහතා | 2013.10.01 |
| 8 | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | බර්නාඩ් කාරියවසම් මහතා | 2010.05.24 |
| 9 | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | රනිල් ප්‍රියන්ත ප්‍රනාන්දු මහතා | 2010.05.24 |
| 10 | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | ඒ.එච්.සුරේෂ් ඉන්දික මහතා | 2010.05.24 |
| 11 | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | අජිත් කිත්සිරි බණ්ඩාර මහතා | 2010.05.24 |
| 12 | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | බී.පී.එස්. ගුණතිලක මිය | 2013.07.08 |

# 2014
## ප්‍රධාන නිලධාරි මණ්ඩලය

ප්‍රධාන නිලධාරි මණ්ඩලය 01.01.2014 සිට 31.12.2014 දක්වා

| අනු අංක | තනතුර | නම | පත්වු දිනය |
|---|---|---|---|
| 1 | සභාපති | නීතිඥ පාලිත ගමගේ මහතා | 2010.05.24 |
| 2 | අධ්‍යක්ෂ ජනරාල් | වෛද්‍ය සුමිත් වන්නිආරච්චි මහතා | 2010.05.26 |
| 3 | අධ්‍යක්ෂ (සමාජ සජීවීකරණ) | වයි.ආර්. ද සිල්වා මහතා | 2011.11.01 |
| 4 | අධ්‍යක්ෂ (මුදල්) | එන්.පී.පී. ඩයස් මහතා | 2011.02.01 |
| 5 | අධ්‍යක්ෂ ( සැලසුම් හා ක.තො.ප) | එම්.ඩී.කේ. චන්ද්‍රසේන මහතා | 2011.02.01 |
| 6 | අභ්‍යන්තර විගණක | එල්.ආර්.ඒ.ශාන්ත මහතා | 2011.02.01 |
| 7 | සහකාර අධ්‍යක්ෂ (නීති) | ඩී. ඒ. දේවිකා දිසානායක මහත්මිය | 2011.11.01 |
| 8 | සහකාර අධ්‍යක්ෂ (සමාජ සජීවීකරණ) | පී.එස්. ගමගේ මෙනෙවිය | 2011.11.01 |
| 9 | සහකාර අධ්‍යක්ෂ (පර්යේෂණ හා සංවර්ධන) | කේ.කේ.ඩබ්.ටී.පී. ද සිල්වා මහත්මිය | 2011.11.01 |
| 10 | සහකාර අධ්‍යක්ෂ (ප්‍රසම්පාදන) | ආර්.ඩී.එස්. ප්‍රනාන්දු මහතා | 2014.05.26 |
| 11 | සහකාර අධ්‍යක්ෂ (මුදල්) | ඒ.එම්.කේ. බණ්ඩාර අතාවුද මහතා | 2012.06.11 |
| 12 | සහකාර අධ්‍යක්ෂ (වාස්තු විද්‍යා) | එම්.එස්.වී. විපුලගුණ මහත්මිය | 2012.08.08 |
| 13 | සහකාර අධ්‍යක්ෂ (ඉඩම්) | ඩබ්.පී.යූ. කේ. පෙර්රා | 2014.11.10 |
| 14 | සහකාර අධ්‍යක්ෂ (පරිපාලන) | ඒ.පී.ආර්. ඥානප්‍රිය මහතා | 2014.11.17 |

# 2014 සංවිධාන ව්‍යුහය



## සභාපතිතුමාගේ සමාලෝචනය

නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය 2008 අංක 36 දරන නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය පනත මගින් ස්ථාපිත කර 2014 වර්ෂය අවසාන වන විට 6 වන වර්ෂ පූර්ණය සනිටුහන් කරයි. නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය ආරම්භයේ සිට මේ වන තෙක් සහ ඉදිරියටත් නාගරික ජනාවාසවල ජීවත් වන අඩු ආදායම්ලාභී ප්‍රජාව ඉලක්ක කරගනිමින් භෞතික හා මානව සංවර්ධනය යන දෙවදෑරුම් ප්‍රවේශයන් යටතේ වැඩසටහන් සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම සිදුකරනු ලබයි.

මෙම දෙවදෑරුම් ප්‍රවේශයන් අතුරින් භෞතික සංවර්ධනය යන සංකල්පය යටතේ මේ වන විට සම්පූර්ණයෙන් නිමකරන ලද නිවාස 456 ක ප්‍රමාණයක් (වටිනාකම රුපියල් මිලියන 1475.5) ජාතික නිවාස සංචිතයට එකතු කිරිමට හැකි වී තිබේ. තවද මෙම වර්ෂයේ අවිච්ඡේද ව්‍යාපෘති ලෙස මොරටුව ලුනාව නාගරික මහල් නිවාස ව්‍යාපෘතිය, තලවාකැලේ ලිඳුල නාගරික ප්‍රති නිවාසකරණ ව්‍යාපෘතිය හා හලාවත ප්‍රතිනිවාසකරණ ව්‍යාපෘතිය දැක්විය හැකි අතර ලුනාව නාගරික මහල් නිවාස ව්‍යාපෘතිය වර්ග අඩි 460 කින් යුත් නිවාස ඒකක 356 කින් සමන්විත වන අතර 2014 දෙසැම්බර් 31 වන දිනට එහි භෞතික ප්‍රගතිය 45% පමණ විය. එහි සංශෝධික මුළු ඇස්තමේන්තුගත පිරිවැය රු.මි. 1369.32 කි.

තලවාකැලේ ලිඳුල නාගරික ප්‍රතිනිවාසකරණ ව්‍යාපෘතිය නිවාස ඒකක 54 කින් (පළමු අදියර) සමන්විත වන අතර එහි ඇස්තමේන්තුගත පිරිවැය රු.මි. 84.5 වේ. 2014 දෙසැම්බර් 31 වන දිනට එහි භෞතික ප්‍රගතිය 60% ක් පමණ වේ.

හලාවත නාගරික ප්‍රතිනිවාසකරණ ව්‍යාපෘතිය වර්ග අඩි 500 කින් යුත් නිවාස ඒකක 57 කින් සමන්විත වන අතර එහි ඇස්තමේන්තුගත පිරිවැය රුපියල් මිලියන 49.7 කි. 2014 දෙසැම්බර් 31 වන දිනට එහි භෞතික ප්‍රගතිය 100% පමණ විය.

ඒඅනුව නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියේ 2014 වර්ෂයේ අවිච්ඡේද ව්‍යාපෘති වන මොරටුව ලුනාව නාගරික මහල් නිවාස ව්‍යාපෘතිය, තලවාකැලේ ලිඳුල නාගරික ප්‍රතිනිවාසකරණ ව්‍යාපෘතිය හා හලාවත ප්‍රතිනිවාසකරණ ව්‍යාපෘතිය යන ව්‍යාපෘතීන් මගින් ඉදිරියේ දී ජාතික නිවාස සංචිතයට එකතු කිරීමට බලාපොරොත්තු වන නිවාස ඒකක ගණන 467 කි.

2012 වර්ෂයේදී ආරම්භ කරන ලද ''ජනසෙවණ'' දිරිය නාගරික නිවාස වැඩසටහන මගින් කොළඹ දිස්ත්‍රික්කය තුල නිවාසලාභීන් 252 ගේ නිවාස අවශ්‍යතාවය සපුරා ඇති අතර මෙම වැඩසටහනේ දෙවන අදියර ලෙස කොළඹ දිස්ත්‍රික්කයේ කඩුවෙල මහ නගර සභා බල ප්‍රදේශය තුල පිහිටි ස්ථිර අර්ධ නිමි නිවාස හිමි 260 ගේ නිවාස ප්‍රතිනිවාසකරණය සඳහා උපරිම ණය සීමාව රු. 200,000.00 ට යටත්, මුළු වටිනාකම රු.මි. 50 ක පිරිවැයකින් යුත් නිවාස ණය ව්‍යාපෘතියක් 2014 වර්ෂය තුල ක්‍රියාත්මක කල අතර වර්ෂය අවසාන වන විට එහි 42% ක පමණ භෞතික ප්‍රගතියක් ලබා තිබුණි.

2011 වසරේදී ආරම්භ කරන ලද අඩුපහසුකම් නාගරික ජනාවාසවල ජීවත් වන ප්‍රජාව සමාජ, ආර්ථික හා සංස්කෘතික වශයෙන් බලගැන්වීම අරමුණු කරගත් ජනසෙවණ ස්වශක්ති මානව සංවර්ධන වැඩසටහන මෙම වසරේදි සාර්ථකව ක්‍රියාත්මක කෙරිණි. මේ යටතේ ජනාවාසවල ජීවත් වන ළමා, තරුණ තරුණියන් විවිධ තරඟ හා වෘත්තීය පුහුණු වැඩසටහන් සඳහා යොමුකරවීම සිදුකෙරුණු අතර කාන්තාවන් මූලික කොට ගෙන ස්වයං රැකියාවක් වශයෙන් කෙටි ආහාර නිෂ්පාදනය කර අලෙවියෙහි යෙදෙන ජනාවාස වල ජීවත්වන කාන්තාවන් 200 ගේ සහභාගිත්වයෙන් වීදි ආහාර වැඩසටහනක් කොළඹ 07 ග්‍රීන්පාත්හි ක්‍රියාත්මක කෙරිණි. මෙහිදි එම කර්මාන්තයෙහි නිරත කාන්තාවන් දිරිගැන්වීම වෙනුවෙන් නොමිලේ ගෑස් සිලින්ඩරයක් හා ගෑස් ලිපක් ලබාදීම සිදුකෙරිණි.

2014 ලෝක ජනාවාස දිනය නාගරික අඩු පහසුකම් ජනාවාසයන්හි ජීවත්වන ළමයි, තරුණ තරුණියන්, කාන්තාවන් ඉලක්ක කර ගනිමින් චිත්‍ර තරඟ, රචනා තරඟ, නාට්‍ය තරඟ හා ක්‍රිකට් තරඟ සංවිධානය කර මහත් උත්කර්ශවත් අයුරින් සැමරීම සිදුකරන ලදි.

2014 වර්ෂය අවිච්ඡේද ව්‍යාපෘති අඛන්ඩව ක්‍රියාත්මක කිරීම හා නව ව්‍යාපෘති රැසක් ක්‍රියාත්මක කිරීම තුලින් අධිකාරියේ දැක්ම වන "තිරසර නාගරික ජනාවාස තුල උසස් ජීවන රටාවක් සහතික කිරීම" සාක්ෂාත් කරගැනීමට කටයුතු කල වර්ෂයක් ලෙස දැක්විය හැක.

**රංජිත් ශාන්ත කහවල**

**සභාපති**

**නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය**

# අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාව

2014.12.31 දිනට නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය පහත සඳහන් පරිදි වේ

නීතිඥ පාලිත ගමගේ
සභාපති
වෛද්‍ය සුමිත් වන්නිආරච්චි
අධ්‍යක්ෂ ජනරාල්
(අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්)
පූජ්‍ය ඉත්තෑකන්දේ සද්ධාතිස්ස හිමි
අධ්‍යක්ෂ
ඩබ්.එම්.පී.ජී. වික්‍රමසිංහ මහතා
අධ්‍යක්ෂ
ඒ.එම්. වීරසේන මහතා
අධ්‍යක්ෂ
ඒ.ඩබ්. දයානන්ද මහතා
අධ්‍යක්ෂ
ටී.එම්.ජේ. බණ්ඩාර මහතා
අධ්‍යක්ෂ
බර්නාඩ් කාරියවසම් මහතා
අධ්‍යක්ෂ
රනිල් ප්‍රියන්ත ප්‍රනාන්දු මහතා
අධ්‍යක්ෂ
ඒ.එච්. සුරේෂ් ඉන්දික මහතා
අධ්‍යක්ෂ
බී. ජී. ඒස්. ගුණතිලක මිය
අධ්‍යක්ෂ
අජිත් කිත්සිරි බණ්ඩාර මහතා
අධ්‍යක්ෂ

සමාලෝචිත වර්ෂය තුළ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් 11 ක් පවත්වා ඇත. අධ්‍යක්ෂ මණ්ඩලයේ අනු කමිටුවක් ලෙස ක්‍රියාත්මක වන විගණන සහ කළමනාකරණ කමිටුව 2014 වර්ෂය තුළදී රැස්වීම් 05 ක් පවත්වා ඇත. අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් වන පහත නම් සඳහන් අධ්‍යක්ෂවරුන් විගණන සහ කළමනාකරණ කමිටුවේ සාමාජිකයින් ලෙස කටයුතු කළහ.

ටී.එම්.ජේ. බණ්ඩාර මහතා - සභාපති

බර්නාඩ් කාරියවසම් මහතා

රනිල් ප්‍රියන්ත ප්‍රනාන්දු මහතා

ඒ.එච්. සුරේෂ් ඉන්දික මහතා

අජිත් කිත්සිරි බණ්ඩාර මහතා

නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය විසින් අඩුපහසුකම් සහිත නාගරික ජනාවාසවල පදිංචි ජනතාවට නිවාස විසඳුම් සපයා දෙන අතර නාගරික ප්‍රදේශවල පිහිටා ඇති ජීවත්වීමට සුදුසු තත්ත්වයේ නැති නිවාස සමූහ උසස් තත්ත්වයකට ගෙන ඒමට කටයුතු කරයි. ඒ හා සමගම නාගරික ජනාවාසවල ජීවත්වන ජනතාවගේ සමාජ ආර්ථික තත්ත්වය සංවර්ධනය කිරීම පිණිස මානව සංවර්ධන වැඩසටහනක් ද ක්‍රියාත්මක කර ඇත.

1971 අංක 38 දරණ මුදල් පනතෙහි 12 වැනි සහ 13.6 වැනි වගන්ති ප්‍රකාරව, නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය විසින් සිදු කරනු ලබන සියලුම ගනුදෙනු නිසිපරිදි ගිණුම්ගත කර ගිණුම්පොත් පවත්වාගෙන යාම සහතික කිරීමේ වගකීම සහ අධිකාරියේ ගිණුම් කටයුතුවල සහ අදාළ වර්ෂය සඳහා අතිරික්තයේ / ඌණතාවයේ සත්‍ය සහ සාධාරණ මතයක් සපයාදෙන මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ වගකීම අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් දරනු ලබයි.

ඒ අනුව, නිසි පරිදි ගිණුම්පොත් පවත්වාගෙන යන ලෙසටත්, නිතිපතා පවත්වනු ලබන රැස්වීම්වලදී සහ විගණන කමිටුව හරහා මූල්‍ය වාර්තාකරණ ක්‍රමවේදය සමාලෝචනය කරන ලෙසටත් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අධිකාරිය වෙත නියෝග කර ඇත.

මෙම වාර්ෂික වාර්තාවේ ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී, සෑම අවස්ථාවකටම අදාළ වන පරිදි නිසි ගිණුම්කරණ ප්‍රමිතීන් අනුගත කර ගැනීමත්, සාධාරණ සහ විචක්ෂණ විනිශ්චයන් සහ ඇස්තමේන්තු මගින් තහවුරු කිරීමත් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සළකා බලා ඇත.

අධිකාරිය සතු වත්කම් ආරක්ෂා කිරීමටත්, වංචා සහ අනෙකුත් අක්‍රමිකතා සොයාගැනීමට සහ ඒවා වලක්වා ගැනීමටත් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඔවුන්ට ප්‍රායෝගිකව ගත හැකි සියලු ක්‍රියාමාර්ග ගෙන ඇත. මේ සම්බන්ධයෙන් කටයුතු කිරීමේදී, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අධිකාරියේ වත්කම් ආරක්ෂා කරගැනීමට සහ එහි වාර්තාවන්හි නිරවද්‍යතාවය සහ විශ්වාසනීයත්වය ප්‍රායෝගිකව හැකිතාක් දුරට ආරක්ෂා කර ගැනීමට හැකි වන පරිදි නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියේ සේවාවන් ක්‍රමානුකූල ආකාරයකට ඉටුකිරීමට අවශ්‍ය කරන, අභ්‍යන්තර පරීක්ෂා කිරීම්, අභ්‍යන්තර විගණන සහ මූල්‍ය හා අනෙකුත් පාලනවලින් සමන්විත ඵලදායී සහ පරිපූර්ණ අභ්‍යන්තර පාලන පද්ධතියක් ස්ථාපනය කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්

**ඉංජි.බෙනඩික්ට් උල්ලුවිස්හේවා**

**අධ්‍යක්ෂ ජනරාල්**

**නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය**

# විගණන කමිටු වාර්තාව

මනා මූල්‍ය වාර්තාකරණ ක්‍රමවේදයක් පවතින බව සහතික කිරීම සඳහා සහ කළමනාකරණයට සහ අදාළ බලධාරීන්ට නිවැරදි, යෝග්‍ය සහ කාලීන වූ තොරතුරු සපයාදීමට හැකිවන පරිදි එය හොඳින් කළමනාකරණය කෙරෙන බව සහතික කිරීම සඳහාත්, නීති සහ අධිකාරියේ ප්‍රතිපත්තිවලට සහ ව්‍යවස්ථාපිත සහ සංස්ථාපිත පාලනයන්ට අනුකූල වන පරිදි ගිණුම්කරණ සහ අභ්‍යන්තර පාලන කළමනාකරණය කිරීම සඳහාත්,  සමාලෝචනය කිරීමේ සහ අධීක්ෂණය කිරීමේ බලතල විගණන කමිටුවට පැවරී තිබේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ භාණ්ඩාගාර නියෝජිත සහ අනෙකුත් අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් 04 දෙනෙකුගෙන් විගණන කමිටුව සමන්විත විය. රාජ්‍ය ව්‍යවසාය මාර්ගෝපදේශයන්ට අනුව, අධ්‍යක්ෂ මණ්ඩලයේ භාණ්ඩාගාර නියෝජිත, අධ්‍යක්ෂ - ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව, ටී.එම්.ජේ. බණ්ඩාර මහතා 2014 වර්ෂයේ කමිටු සභාපති ලෙස කටයුතු කළේය. බර්නාඩ් කාරියවසම්, රනිල් ප්‍රියන්ත ප්‍රනාන්දු, ඒ.එස්. සුරේෂ් ඉන්දික සහ අජිත් කිත්සිරි බණ්ඩාර යන මහත්වරු කමිටු සාමාජිකයින් ලෙස කටයුතු කළහ.

රජයේ විගණන අධිකාරී සහ රේඛීය අමාත්‍යාංශයේ ප්‍රධාන අභ්‍යන්තර විගණක නිරීක්ෂකයන් ලෙස විගණන කළමනාකරණ කමිටු රැස්වීම්වලට සහභාගී වූ අතර අවශ්‍ය පරිදි නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියේ අනෙකුත් නිලධාරීන් ගණනාවක් රැස්වීම්වලට සහභාගී විය. අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් කමිටුවේ ලේකම් ලෙස කටයුතු කළේය. අභ්‍යන්තර විගණක විසින් සකස් කරන ලද, 2014 වර්ෂය සඳහා වූ අභ්‍යන්තර විගණන සැලැස්ම කමිටුව විසින් සළකා බලා අනුමත කරන ලදී.

සමාලෝචිත වර්ෂය තුළ කමිටුව රැස්වීම් වාර 05 ක් පවත්වා ඇත. විගණන වාර්තා, විගණන විමසුම් වලට අදාළ ගැටළු සහ පිළිතුරු, අභ්‍යන්තර සහ බාහිර විගණනයන්හි නිරීක්ෂණ, අභ්‍යන්තර පාලන පද්ධතීන් මෙන්ම වාර්ෂික වාර්තාව නිසි කලට සකස් කර ඉදිරිපත් කිරීමේ අවශ්‍යතාවය පිළිබඳව විශේෂ අවධානය යොමු කිරීමද ඇතුළත්ව වැඩිදියුණු කිරීම් අවශ්‍ය අනෙකුත් ක්ෂේත්‍ර පිළිබඳව කමිටුව සාකච්ඡා කරන ලදී. අවශ්‍ය නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගෙන ඇති අතර ගනු ලැබූ තීරණවලට අදාළ පසුවිපරම් ක්‍රියාමාර්ග ද සාකච්ඡා කරන ලදී. සාකච්ඡා කරන ලද ප්‍රමුඛ කරුණු ඇතුලත් රැස්වීම් සාකච්ඡා සටහන් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තා කරන ලදී.

සාමාජිකයින් සහ නිලධාරීන් විසින් ලබාදුන් වටිනා දායකත්වය මෙන්ම විශේෂයෙන්ම විගණන ක්‍රියාවලියේදී විගණකාධිපති විසින් ලබාදුන් ඉතා වටිනා නිරීක්ෂණයන් ද මම අවංකවම ඉතා අගයකොට සළකමි.

විගණන හා කළමනාකරණ කමිටුවේ අණ පරිදි,

විගණන හා කළමනාකරණ කමිටු ලේකම්

ඉංජි.බෙනඩික්ට් උල්ලුවිස්හේවා
අධ්‍යක්ෂ ජනරාල්
නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය

# ක්‍රියාත්මක වැඩසටහන් - 2014

2014 වර්ෂයේදී නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය විසින් පහත සඳහන් ආකාරයට සංවර්ධන වැඩසටහන් 03 ක් ක්‍රියාත්මක කර ඇත.

1. භෞතික සංවර්ධන වැඩසටහන
    1.1 නාගරික අඩු පහසුකම් ජනාවාසවල ජනතාව සඳහා ප්‍රතිනිවාසකරණ වැඩසටහන
2. නාගරික ප්‍රදේශවල පිහිටි තාවකාලික සහ අර්ධ ස්ථිර නිවාස ප්‍රමිතිගත නිවාස බවට පත් කිරීමේ "ජනසෙවණ දිරිය" නාගරික නිවාස වැඩසටහන
3. "ජනසෙවණ ස්වශක්ති" මානව සංවර්ධන වැඩසටහන

# භෞතික සංවර්ධන වැඩසටහන

නාගරික ප්‍රදේශවල ජනතාවගේ ජීවන තත්වය උසස් කිරීම සඳහා ඔවුන්ගේ නිවාස ඇතුළු භෞතික පරිසරය , සාකල්‍ය නාගරික සහ ජනාවාස සංවර්ධන ප්‍රවේශයක් යටතේ සංවර්ධනය කිරීම නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියේ මුඛ්‍ය අරමුණ වන අතර ඉලක්ක ප්‍රජාව සමාජ, ආර්ථික සහ සංස්කෘතික වශයෙන් බලගැන්වීම ද අප අධිකාරියේ අරමුණු අතර වේ.

ඒ අනුව වර්ෂ 2011 දී ආරම්භ කරන ලද භෞතික සංවර්ධන වැඩසටහන පහත ප්‍රධාන වැඩසටහන් දෙක යටතේ ක්‍රියාත්මක වේ.

1. නාගරික අඩු පහසුකම් ජනාවාසවල ජනතාව සඳහා ප්‍රතිනිවාසකරණ වැඩසටහන
2. නාගරික ප්‍රදේශවල පිහිටි තාවකාලික සහ අර්ධ ස්ථිර නිවාස ප්‍රමිතිගත නිවාස බවට පත් කිරීමේ වැඩසටහන

**නාගරික අඩු පහසුකම් ජනාවාසවල ජනතාව සඳහා ප්‍රතිනිවාසකරණ වැඩසටහන**

2011 වර්ෂයේ සිට ක්‍රියාත්මක මෙම වැඩසටහන 2014 වර්ෂය තුළ ද සාර්ථකව ක්‍රියාත්මක කෙරිණි. නාගරික බල ප්‍රදේශයන්ට අයත්, පළාත් පාලන ආයතනයන් හි පිහිටි අඩු පහසුකම් ජනාවාසවල තොරතුරු එම ආයතන ප්‍රධානීන් හරහා ලබාගත් පසු සකස් කරන ලද ව්‍යාපෘති යෝජනා ජාතික සැලසුම් දෙපාර්තමේන්තුවේ අනුමැතිය වෙත යොමුකොට අනුමත කරගන්නා ලද ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම මෙහිදී සිදු වේ.

මේ යටතේ අඛණ්ඩ ව්‍යාපෘති සහ නව ව්‍යාපෘති රැසක් 2014 වර්ෂයේ දී ක්‍රියාත්මක කරන ලදී.

***අඛණ්ඩ ව්‍යාපෘති***

- මොරටුව අඟුලාන මහල් නිවාස ව්‍යාපෘතිය
- මොරටුව ලුනාව මහල් නිවාස ව්‍යාපෘතිය
- ජනසෙවණ දිරිය නාගරික නිවාස වැඩසටහන (අදියර I)
- තලවකැලේ - ලිඳුල නාගරික ප්‍රතිනිවාසකරණ ව්‍යාපෘතිය
- හලාවත නාගරික ප්‍රතිනිවාසකරණ ව්‍යාපෘතිය

***නව ව්‍යාපෘති***

- ජනසෙවණ දිරිය නාගරික නිවාස වැඩසටහන (අදියර II)
- සීතාවකපුර නිවාස ව්‍යාපෘතිය
- ත්‍රිකුණාමල සමුද්‍රගම නිවාස ව්‍යාපෘතිය

# මොරටුව අඟුලාන නාගරික මහල් නිවාස ව්‍යාපෘතිය

***මොරටුව නාගරික, පාරිසරික හා මානව ජනාවාස සංවර්ධන වැඩසටහන***

මොරටුව නාගරික, පාරිසරික හා මානව ජනාවාස සංවර්ධන වැඩසටහන යටතේ ක්‍රියාත්මක මොරටුව අඟුලාන මහල් නිවාස ව්‍යාපෘතිය, මොරටුව අඟුලාන මුහුදුබඩ ප්‍රදේශයේ සුනාමි ව්‍යසනයෙන් හා වරින් වර සිදුවන මුහුදු ඛාදනයන්ගෙන් පීඩාවට පත් වන, ස්ථිර නිවසක් නොමැතිව, අඩු පහසුකම් යටතේ ජීවත්වන ප්‍රජාව හා මොරටුව නාගරික කලාපයේ ජීවත්වන අඩු ආදායම්ලාභී ප්‍රජාව සඳහා ස්ථිර නිවාස විසඳුම් ලබා දීමේ හා ඔවුන්ගේ ජීවන තත්ත්වය උසස් කිරීමේ අරමුණින් ආරම්භ කරන ලද ව්‍යාපෘතියකි.

මොරටුව මහ නගර සභා බල ප්‍රදේශයේ අඟුලාන ග්‍රාම නිලධාරි වසමේ ඉදිවූ මෙම ප්‍රතිනිවාසකරණ ව්‍යාපෘතියේ ඉදිකිරීම් 2011 ජුනි මස ආරම්භ කරන ලදි.



**අඟුලාන "සයුරුපුර' නිවාස ව්‍යාපෘතිය ජනතා අයිතියට පත් කිරීම**

බැල්කනියක්, සාලයක් සමග කෑම කාමරයක්, නිදන කාමර 02 ක්, මුළුතැන්ගෙයක් හා වැසිකිලියක් සහිත නාන කාමරයක් ඇතුළුව වර්ග අඩි 500 පමණ වර්ග ප්‍රමාණයකින් යුත් නිවාස ඒකක 288 කින් සමන්විතව මහල් 09 කින් මෙම ව්‍යාපෘතිය ඉදි විය. ප්‍රජා ශාලාවක්, විදුලි සෝපාන 06 ක් ඇතුළුව සියලු මහල් නිවාස යටිතල පහසුකම් සහිතව, රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ ඉදිකිරීම් හා උපදේශකත්වය යටතේ ඉදි වූ මෙම මහල් නිවාස ව්‍යාපෘතිය 2014 නොවැම්බර් මස 18 වන දින අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා අතින් ජනතා අයිතියට පත් කරන ලදි. සංශෝධිත මුළු ඇස්තමේන්තුගත පිරිවැය වන රු.මිලි. 1,255.578 ක් විය.




***නිවාස ව්‍යාපෘතිය ජනතා අයිතියට පත් කිරීම***

## 'සයුරුපුර' නිවාස ව්‍යාපෘතියේ මළාපවාහනය සඳහා නිර්වායුවී දිරවීමේ පද්ධතිය (Anaerobic Digestion System)



මධ්‍යම පද්ධතියක් සහිත කොළඹ නගරයෙන් පිටත නාගරික මහල් නිවාස ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී මුහුණ දෙන ප්‍රධාන ගැටළුවකි, මළාපවාහණය. අඩු ආදායම්ලාභී නිවාස යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීමේදී මෙම තත්වය තීරණාත්මක වන්නේ මෙහෙයුම් සහ නඩත්තුව (Operation and Maintenance) සම්බන්ධ පිරිවැය එම ප්‍රජාවට දැරිය හැකි මට්ටමක පවත්වා ගැනීම අත්‍යාවශ්‍ය වන බැවිනි.



වෙනත් නිවාස යෝජනා ක්‍රමවල ක්‍රියාත්මක වන මළාපවාහන පද්ධති වල තත්වය සහ පිරිවැය සම්බන්ධයෙන් අධ්‍යනය කිරීමෙන් පසුව උක්ත නිවාස යෝජනා ක්‍රමය සඳහා නිර්වායුවී පද්ධතියක් යෙදවීම සඳහා තීරණය කරනු ලැබීය.

නිර්වායුවී දිරවීමේ පද්ධතිය භාවිතා කිරීමේ වාසි :-

- හරිතාගාර වායු පිටකිරීම අවම මට්ටමක පවතියි.
- මීතේන් වායුව නිපදවීම උපරිම මට්ටමක පවතියි.
- දේශගුණ වෙනස්කම් සඳහා බලපාන කාබන් මට්ටම ඉහළ නොයන පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයක් ලෙස ක්‍රියා කරයි.
- ක්‍රියාවලිය සඳහා විදුලිය හෝ වෙනත් බලශක්ති ප්‍රභවයක් භාවිත කිරීමට අවශ්‍ය නොවීම.
- පරිසර තත්වයන්ට ගැලපෙන ක්‍රියාවලියකි.

- ස්වායු පද්ධතියකට වඩා අවම ඓන්ද්‍රික කොටස් ප්‍රමාණයක් ඉතිරි වීම.
- දිරවීමේ ක්‍රියාවලිය මගින් ගෑස්, ජලය සහ අවම ඓන්ද්‍රික කොටස් ප්‍රමාණයක් ඉතිරි වීම.
- වායු කැවීමේ ක්‍රියාවක් සිදු නොකරන බැවින් අවම මෙහෙයුම් පිරිවැය.
- අවම නඩත්තු පිරිවැය.
- වෙනත් පද්ධති වලට සාපේක්ෂව වැඩි ධාරිතා වෙනසක් දැරීමට හැකි වීම.
- වර්තමානයේ ප්‍රචලිත කරනු ලබන හරිත සංකල්පයට අනුගත පද්ධතියක් වීම.

මෙම තත්වයන් සලකා බැලීමේදී මෙවැනි නාගරික අඩු/මධ්‍යම ආදායම්ලාභීන් සඳහා ගැලපෙන පරිසර හිතකාමී මළාපවාහණ පද්ධතියක් ලෙස මෙම නිර්වායුවී දිරවීමේ පද්ධතිය (Anaerobic Digestion System) වඩාත් යෝග්‍ය වේ.

## 'සයුරුපුර' නිවාස ව්‍යාපෘතියේ ප්‍රජා සහ පොදු පහසුකම්




හදිසි විදුලි බිඳ වැටීමකදී පොදු ප්‍රදේශවලට සහ විදුලි සෝපානවලට විදුලිය සැපයීම සඳහා වන විදුලිජනක යන්ත්‍රය සහ ප්‍රධාන විදුලි පද්ධතිය මගින් ප්‍රශස්ත විදුලි සැපයුමක් සහතික කිරීම සඳහා තෙකලා විදුලි ට්‍රාන්ස්පෝමරය සහ ඒ සඳහා වූ බාහිර විදුලි සම්බන්ධතාවයක් පවතින අතර නවීන මහල් නිවාසවල භාවිතා වන ප්‍රමිතිගත ගිනි ආරක්ෂක පද්ධතියක් ද පවතියි.



ප්‍රදේශයේ ජල සැපයීමේ තත්වයන් සැලකිල්ලට ගනිමින් අඛණ්ඩව ජලය සැපයිය හැකි සේ ප්‍රමාණවත් ධාරිතාවක් සහිතව ඉදිකරන ලද භූගත ජලය ගබඩා කිරීමේ ටැංකි, ගොඩනැගිල්ලේ ඉහළ පිහිටි ජලය බෙදා හැරීමේ ටැංකි සහ පොම්පාගාරයකින් ද සමන්විත වන සේ නිවාස ව්‍යාපෘතිය ඉදි කොට ඇත.

ඉහත ගොඩනැගිල්ලෙහි බිම් මහළ තුළ ව.අඩි. 2,650.00 ක ප්‍රමාණයේ සියළු පහසුකම් සහිත, උක්ත ප්‍රජාවගේ උත්සව කටයුතු සඳහා ද භාවිතා කළ හැකි වන සේ සකස් කළ අංග සම්පූර්ණ ප්‍රජා ශාලාවක් ඉදිකොට ඇති අතර ඒ අනුව සියළු පොදු පහසුකම් ද ඇතුළුව ව.අඩි. 6,150.00 ක පොදු ප්‍රදේශයක් පවතියි.

ව්‍යාපෘතියේ සහ ප්‍රතිලාභීන්ගේ පෞද්ගලිකත්වය ආරක්ෂා වන පරිදි සකස් කරන ලද කාපට් මාර්ග, මායිම් වැට, ගේට්ටු සහිත ආරක්ෂිත පරිසරයකින් යුක්ත මෙම නිවාස ව්‍යාපෘතියෙහි ග්‍රාම සේවක කාර්යාලයක් ද ඉදි කොට ඇත.

# මොරටුව ලුනාව නාගරික මහල් නිවාස ව්‍යාපෘතිය





මොරටුව ලුනාව මහල් නිවාස ව්‍යාපෘතිය, මොරටුව නාගරික, පාරිසරික හා මානව ජනාවාස සංවර්ධන වැඩසටහන යටතේ ක්‍රියාත්මක දෙවන ව්‍යාපෘතිය වේ. මොරටුව ලුනාව මුහුදුබඩ අවදානම් කලාපයේ ස්ථිර නිවසක් නොමැතිව අඩු පහසුකම් යටතේ ජීවත්වන ප්‍රජාව සඳහා ස්ථිර නිවාස විසඳුම් ලබා දීමේ හා ඔවුන්ගේ ජීවන තත්ත්වය උසස් කිරීමේ අරමුණින් ආරම්භ කරන ලද ව්‍යාපෘතියකි.

මොරටුව මහ නගර සභා බල ප්‍රදේශයේ ලුනාව ග්‍රාම නිලධාරි වසමේ ඉදිවූ මෙම ප්‍රතිනිවාසකරණ ව්‍යාපෘතිය, 2012 ජූලි මස රුපියල් මිලියන 875 ක මුළු ඇස්තමේන්තුගත පිරිවැයක් සහිතව ඉදිකිරීම් ආරම්භ කරන ලදී. බැල්කනියක්, සාලයක් සමග කෑම කාමරයක්, නිදන කාමර 02 ක්, මුළුතැන්ගෙයක් හා වැසිකිලියක් සහිත නාන කාමරයක් ඇතුළුව වර්ග අඩි 460 ක පමණ වර්ග ප්‍රමාණයකින් යුත් නිවාස ඒකක 356 කින් සමන්විත මෙම මහල් නිවාස ව්‍යාපෘතියේ 2014 දෙසැම්බර් 31 වන දිනට භෞතික ප්‍රගතිය 45% ක් විය. සංශෝධිත මුළු ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලි. 1,369.316 කි.

# තලවකැලේ - ලිඳුල නාගරික ප්‍රතිනිවාසකරණ ව්‍යාපෘතිය

## *ප්‍රජා සහභාගිත්ව සංවර්ධන ප්‍රවේශය*



තලවකැලේ - ලිඳුල නිවාසකරණ ව්‍යාපෘතිය, තලවකැලේ නගරය තුළ හඳුනාගත් අඩු පහසුකම් ජනාවාස 03 ක ප්‍රජාවගේ නිවාස අවශ්‍යතාවය ඉටු කිරීමත්, ඉහළ සංචාරක විභවයක් සහිත පරිසර සංවේදී නාගරික කලාපයක් වන තලවකැලේ නගරය සංවර්ධනය කිරීමත් යන මූලික අරමුණු ඇතිව ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතියක් වන අතර මෙය 2012 ජූලි මස රුපියල් මිලියන 84.5 ක මුළු ඇස්තමේන්තුගත පිරිවැයක් සහිතව ඉදිකිරීම් ආරම්භ කරන ලද ව්‍යාපෘතියකි.

තලවකැලේ නගර මධ්‍යයේ වූ "උඩලයිම", පැරණි වෙළඳපොළ අසළ හා "ලෝගිය" යන ජනාවාසයන්හි ජිවත් වන කුටුම්භ 96 ක් තලවකැලේ - ලිඳුල නිවාසකරණ ව්‍යාපෘතිය සඳහා හඳුනා ගත් අතර මෙම ව්‍යාපෘතියේ පළමු අදියර සඳහා උඩලයිම", පැරණි වෙළඳපොළ අසළ ජනාවාසයන්හි ජිවත් වන කුටුම්භ අතරින් කුටුම්භ 54 ක් ප්‍රතිලාභීන් ලෙස හඳුනා ගැණිනි.

## තලවකැලේ - ලිඳුල නිවාසකරණ ව්‍යාපෘතිය සඳහා ප්‍රජා සහභාගිත්ව සංවර්ධන ප්‍රවේශය යොදා ගැනීම

අඩු පහසුකම් ජනාවාසවල අඩු ආදායම් නාගරික ප්‍රජාව සඳහා නිවාස ඉදිකිරීමේදී දැරීමට සිදුවන ඉහළ ඉදිකිරීම් පිරිවැය අවම කර ගැනීම, සැලසුම් කළ කාලය තුළ ව්‍යාපෘතිය ජනතා අයිතියට පත් කිරීම, තම නිවස ඉදිකර ගැනීමට ප්‍රතිලාභියා ද සහභාගි වීම තුළ ඇතිවන ස්වයං උනන්දුව "ප්‍රජා සහභාගිත්ව සංවර්ධන ප්‍රවේශය" තුළින්, තලවකැලේ - ලිඳුල නිවාසකරණ ව්‍යාපෘතියෙන් අත්වන වාසිදායක තත්ත්වයන් ය. මෙම නිවාස ව්‍යාපෘතිය සැලසුම් කිරීමේ සිට නිවාස ප්‍රතිලාභීන් වෙත ලබා දීමෙන් පසු නිවාස නඩත්තු කිරීම දක්වා වූ සියලු අදියර ප්‍රජා සහභාගිත්ව ක්‍රමවේදයක් තුළ ක්‍රියාත්මක වන අතර 2014 දෙසැම්බර් 31 වන දිනට භෞතික ප්‍රගතිය 60% ක් විය.





**ප්‍රජා සහභාගිත්ව සංවර්ධන ප්‍රවේශය යටතේ නිවාස ව්‍යාපෘතිය ඉදිකිරීම**

# හලාවත නාගරික ප්‍රතිනිවාසකරණ ව්‍යාපෘතිය

## *ප්‍රජා සහභාගීත්ව සංවර්ධන ප්‍රවේශය*

හලාවත නගර මධ්‍යයේ අඩු පහසුකම් යටතේ ජීවත්වන, හලාවත නගර සභාවේ සේවය කරන කම්කරු ප්‍රජාව සඳහා නිවාස විසඳුම් ලබා දෙමින් ඔවුන් ආර්ථික, සමාජීය හා සංස්කෘතික වශයෙන් බලගැන්වීමත්, හලාවත නගරය තිරසාර නගරයක් ලෙස ප්‍රතිසංවර්ධනය කිරීමේත් අරමුණු සහිතව 2013 සැප්තැම්බර් මස රුපියල් මිලියන 49.7 ක මුළු ඇස්තමේන්තුගත පිරිවැයක් සහිතව ඉදිකිරීම් ආරම්භ කරන ලද ව්‍යාපෘතියකි.





*හලාවත නගර මධ්‍යයේ අවිධිමත්ව විසිරී ඇති හලාවත නගර සභා කම්කරුවන්ගේ තාවකාලික නිවාස*

මෙම නිවාස ව්‍යාපෘතිය ' ප්‍රතිලාභී සහභාගීත්ව සංවර්ධන ක්‍රමවේදයකට ' අනුව සිදුකිරීමට කටයුතු කළ අතර ඉදිකිරීම් පිරිවැය අවම කරගැනීම සඳහා පරිසර හිතකාමී ඉදිකිරීම් තාක්ෂණ ක්‍රමවේදයන් (සම්පීඩිත පස්, ගඩොල්) අත්හදා බැලීම සිදු කෙරිණි.

ඒ අනුව, පර්චස් 06 ක භූමි ප්‍රමාණයක් තුළ විසිත්ත කාමරයක්, නිදන කාමර 02 ක්, මුළුතැන්ගෙයක් හා වැසිකිලියක් සහිත නාන කාමරයක්, ආලින්දයක් ඇතුළුව වර්ග අඩි 500 ක වර්ග ප්‍රමාණයකින් යුතුව ඉදිකරන ලද තනි නිවාස 57 කින් සමන්විත මෙම නිවාස ව්‍යාපෘතියේ 2014 දෙසැම්බර් 31 වන දිනට ඉදිකිරීම් වල භෞතික ප්‍රගතිය 100% ක් විය.





නාගරික කලාප තුළ ජීවත්වන ප්‍රජාව සඳහා නිවාස විසඳුම් ලබා දෙමින් එම ප්‍රජාවගේ තාවකාලික හා අර්ධ නිම් නිවාස, ප්‍රමිතිගත නිවාස බවට පත් කිරීම, ප්‍රජාව ආර්ථික, සමාජීය වශයෙන් බලගැන්වීම හා එමගින් තිරසාර නාගරික නිවාස සංවර්ධන ක්‍රියාවලියක් සහතික කිරීමේ පුළුල් අරමුණු ඇතිව අප අධිකාරියේ භෞතික සංවර්ධන වැඩසටහන යටතේ දිරිය නාගරික නිවාස වැඩසටහන සැලසුම් කරන ලදී.

දෛනික වැටුප් ලබන ශ්‍රමිකයන්, ස්වයං රැකියාවන්හි නිරත ප්‍රජාව වැනි විධිමත් මූල්‍ය අංශය වෙතට යොමු වීමේ හැකියාවන් නොමැති එනම් ස්ථිර මාසික ආදායම් ප්‍රභවයක් රහිත ඉහළ ඇප සුරකුම් ඉදිරිපත් කිරීමේ හැකියාවක් නොමැති අඩු ආදායම්ලාභී ප්‍රජාව ඉලක්ක කර ගනිමින් මෙම නිවාස ව්‍යාපෘතිය ක්‍රියාත්මක වේ.

මෙම නිවාස සංවර්ධන කාර්ය යටතේ මූල්‍ය පහසුකම් සමග තාක්ෂණික උපදේශනය, සැලසුම්කරණය උපදේශනය හා අප අධිකාරිය යටතේ ක්‍රියාත්මක මානව සංවර්ධන වැඩසටහන හරහා එම ප්‍රතිලාභීන් ආර්ථික හා සමාජීය වශයෙන් සවිබල ගැන්වීම ද අන්තර්ගත විය. නිවාස කාර්ය සැලසුම්කරණයේ සිට ඉදිකිරීම් කාර්ය අවසන් වන තුරු නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියේ තාක්ෂණික නිලධාරීන් විසින් අධීක්ෂණය කරන ලදී. මෙම ප්‍රතිලාභීන් මානව සංවර්ධන වැඩසටහන හා සම්බන්ධ කර ගන්නා ලද අතර ඒ හරහා මෙම ප්‍රජාව සවිබල ගැන්වීම අඛණ්ඩව සිදු විය.

2012 වර්ෂයේ ආරම්භ කළ දිරිය නාගරික නිවාස වැඩසටහනේ අදියර I යටතේ කොළඹ දිස්ත්‍රික්කය තුළ කඩුවෙල ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය තුළින් හඳුනාගත් මෙම නිවාස අවශ්‍යතාවය සහිත ප්‍රතිලාභීන් 255 සඳහා රු. මිලි. 52.00 අයවැය ප්‍රතිපාදන ( 2012 වර්ෂයේ දී රු. මිලි. 40.00 ක් හා 2013 වර්ෂයේ දී රු. මිලි. 12.00 ක් ද වශයෙන්) ලැබී තිබුණි.

2012 වර්ෂයේ වාර්ෂික උද්ධමනය වූ 7.53 % ( ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාව - 2012 ) හා පරිපාලන වියදම් සැලකිල්ලට ගෙන 10 % සහන වාර්ෂික පොළී අනුපාතිකයක් අය කරන ලදී. හීනවන ශේෂ ක්‍රමය ( Reducing Balance Method ) අනුව නිවාස ණය වාරික ගණනය කරන ලදී.

දිරිය නාගරික නිවාස වැඩසටහන සඳහා ප්‍රතිලාභීන් තෝරා ගැනීම සඳහා පහත නිර්ණායක යොදා ගන්නා ලදී.

පහත සඳහන් නිර්ණායක 03 සපුරාලන ලද නිවාස ණය ඉල්ලුම්කරුවන්, ප්‍රතිලාභීන් හඳුනා ගැනීම සඳහා වූ සම්මුඛ සාකච්ඡාවට යොමු කරන ලදී.

- නාගරික ප්‍රදේශයක හෝ නිවාස ඉදිකිරීම් නිසා ඉඩමක භුක්තිය හිමි වීම
- වෙනත් නිවාස දේපලකට හිමිකම් නොකීම
- විධිමත් මූල්‍ය ආයතනයකින් නිවාස සංවර්ධනය සඳහා ණය ලබා ගැනීමේ හැකියාවන් නොතිබීම

ඇපකරුවන් දෙදෙනෙකු නිවාස ණය සඳහා ඇප විය යුතු අතර ඉඩමක නීත්‍යානුකූල අයිතිය තමා සතු වන අවස්ථාවක ඉඩමෙහි නිවාස කාර්ය සඳහා නිවාස ණය ලබා දෙනු ඇත.

**ජනසෙවණ දිරිය නාගරික නිවාස වැඩසටහන - පළමු අදියර**

| | |
|---|---|
| ක්‍රියාත්මක නාගරික කලාපය | කොළඹ දිස්ත්‍රිකයේ කඩුවෙල මහ නගර සභා බල ප්‍රදේශය |
| ප්‍රතිලාභීන් ගණන | 255 |
| උපරිම ණය මුදල | රු. 300,000.00 |
| ණය ආපසු ගෙවීමේ කාල සීමාව | අවුරුදු 03 - 10 |
| පළමු අදියර සඳහා මුළු මූල්‍ය වගකීම | රු. මිලියන 52.00 |
| 2013 දෙසැම්බර් 31 වන දිනට භෞතික ප්‍රගතිය | 100 % |

**ජනසෙවණ දිරිය නාගරික නිවාස වැඩසටහන - දෙවන අදියර**

| | |
|---|---|
| ක්‍රියාත්මක නාගරික කලාපය | කොළඹ දිස්ත්‍රික්කය |
| ප්‍රතිලාභීන් ගණන | 260 |
| උපරිම ණය මුදල | රු. 200,000.00 |
| ණය ආපසු ගෙවීමේ උපරිම කාල සීමාව | අවුරුදු 03 - 10 |
| දෙවන අදියර සඳහා මුළු මූල්‍ය වගකීම | රු. මිලියන 50.00 |
| 2014 දෙසැම්බර් 31 වන දිනට භෞතික ප්‍රගතිය | 42% |

# සීතාවකපුර නිවාස ව්‍යාපෘතිය

සීතාවකපුර නගර සභාවට අයත් අක්කර 80 ක භූමි ප්‍රදේශයක 'වැවේකැලේ' නම් ජනාවාසයේ අඩු පහසුකම් යටතේ ජීවත්වන අඩු ආදායම්ලාභී පවුල් 45 සඳහා නිවාස විසඳුම් ලබා දෙමින් ඔවුන්ගේ ජීවන තත්ත්වය උසස් කිරීමේ අරමුණින් සීතාවකපුර නිවාස ව්‍යාපෘතිය සැලසුම් කර ඇත.





**සීතාවකපුර නගර මධ්‍යයේ වූ 'වැවේකැලේ' ජනාවාසයේ අඩු පහසුකම් නිවාස**



රු.මිලි. 34.20 ක මුළු ඇස්තමේන්තුගත පිරිවැයක් සහිතව 2014 දෙසැම්බර් මස 09 වන දින ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍ය ගරු විමල් වීරවංශ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් මෙම නිවාස ව්‍යාපෘතිය ආරම්භ කරන ලද අතර 2014 දෙසැම්බර් 31 වන දිනට භෞතික ප්‍රගතිය 10% ක් විය.

# ත්‍රිකුණාමලය සමුද්‍රගම නිවාස ව්‍යාපෘතිය

ත්‍රිකුණාමලය නගරය, තිරසර නගරයක් ලෙස සංවර්ධනය සඳහා එම නගර මධ්‍යයේ පිහිටි අවිධිමත් ලෙස විසිරී පවතින අඩු පහසුකම් පැල්පත් නිවාස විධිමත් ලෙස සංවර්ධනය කර ප්‍රජාවගේ ජන ජීවිතය ඉහළ නැංවීම කාලීන අවශ්‍යතාවයක් ලෙස හඳුනා ගෙන ඇත.





**ත්‍රිකුණාමලය නගර හා කඩවත් ප්‍රාදේශීය බල ප්‍රදේශයේ මනයාවේලි ග්‍රාම නිලධාරී වසමේ සමුද්‍රගම ග්‍රාමයේ වූ ජනාවාස ප්‍රජාවගේ අඩු පහසුකම් / තාවකාලික නිවාස**

ත්‍රිකුණාමලය නගර මධ්‍යයේ වසර 35 කට වැඩි කාලයක සිට ධීවර කටයුතුවල නියුක්ත පවුල් 125 ක් පමණ ජිවත් වේ. එහි බොහෝ ප්‍රජාවගේ නිවාස සඳහා මූලික අපරවයුහ පහසුකම් ද නොමැති අතර, මෙම අවිධිමත් පැල්පත් නිවාස නගර අලංකරණයට හා ආකර්ෂණයට සෘජු බලපෑමක් සිදු කරයි.

ධීවර කර්මාන්තය හා ධිවර නිවාස අතර වෙන් කළ නොහැකි දැඩි බැඳීමක් පවතින හෙයින්, උක්ත ප්‍රජාව නගරයෙන් පිටත වෙනත් ස්ථානයක පුනස්ථාපනය කිරීම උචිත නොවේ. ඒ අනුව මෙම ප්‍රජාව දැනට පදිංචි ප්‍රදේශයේම තෝරා ගත් බිම් කඩක නිවාස ඒකක 96 කින් සමන්විත නිවාස ව්‍යාපෘතියක පදිංචි කිරීමට නියමිත ය. මෙම නිවාස ව්‍යාපෘතිය මගින් නිදහස් වන බිම් තීරය වෙරළ උද්‍යානයක් ලෙස සංවර්ධනය කිරීමට ද නියමිත ය.







රු.මිලි. 365.98 ක මුළු ඇස්තමේන්තුගත පිරිවැයක් සහිතව ආරම්භ කරන ලද අතර 2014 දෙසැම්බර් 31 වන දිනට භෞතික ප්‍රගතිය 05% ක් විය.

## "ස්වශක්ති" මානව සංවර්ධන වැඩසටහන

නාගරික ජනාවාස සංවර්ධන අධිකාරී පනතින් පැවරුණ කාර්යභාරයක් ලෙස ඌන පහසුකම් නාගරික ජනාවාසයන්හි පවත්නා ප්‍රජාවගේ ආර්ථික, සමාජීය, සංස්කෘතික ප්‍රවර්ධනය උදෙසා එම ප්‍රජාව බලගැන්වීම මෙන්ම එම ප්‍රජාවගේ දරුදැරියන්ගේ හා තරුණ තරුණියන්ගේ දැනුම, කුසලතා හා ආකල්පමය වශයෙන් ධනාත්මක ප්‍රවේශයකට යොමු කිරීම උදෙසා මානව සංවර්ධන වැඩසටහන නාගරික ජනාවාස මට්ටමින් ක්‍රියාවට නැංවීමේ වගකීම මෙම අධිකාරියට පවරා ඇත. එම කාර්යයන් ඉටුකිරීම වෙනුවෙන් "ස්වශක්ති" මානව සංවර්ධන වැඩසටහන වර්ෂ 2011 සිට අඛණ්ඩව පහත සඳහන් ක්ෂේත්‍රයන් ඔස්සේ ක්‍රියාත්මක කෙරේ.

- ප්‍රජා මූල සංවිධාන ශක්තිමත් කරමින් ප්‍රජාව බලගැන්වීම
- ජනාවාස මට්ටමින් ප්‍රජා සංවර්ධන සමිති ස්ථාපිත කිරීම
- ජනාවාස ආශ්‍රිතව ප්‍රජා ක්‍රියාකාරී සැලසුම් සැකසීම හා ක්‍රියාවට නැංවීම
- නාගරික අඩු ආදායම්ලාභීන්ගේ ආර්ථිකය ශක්තිමත් කරන ක්ෂුද්‍ර මූල්‍ය ණය හා ස්වයං රැකියා ප්‍රවර්ධන උපකරණ ලබාදීම
- ප්‍රජාවගේ ව්‍යවසායකත්ව සංවර්ධන හැකියාවන් වර්ධනය උදෙසා අදාළ වෘත්තිමය ආයතනික සම්බන්ධීකරණය හා සහාය ලබාගැනීම
- නාගරික තරුණයන්ගේ ක්‍රීඩා කුසලතාවයන් වර්ධනය උදෙසා ක්‍රීඩා තරඟ සංවිධානය
- නාගරික දරුදැරියන්ගේ කලා කුසලතා ප්‍රවර්ධනය උදෙසා නාට්‍ය, චිත්‍ර, රචනා වැනි වැඩසටහන් සඳහා යොමු කිරීම
- ප්‍රජා ඉදිකිරීම්, ශ්‍රමදාන ව්‍යාපාර හා පාරිසරික සෞඛ්‍ය ප්‍රවර්ධනය
- පුහුණු ශ්‍රමික හා නවීන තාක්ෂණික දැනුමින් සන්නද්ධ වූ ශ්‍රම බලකායක් වෙනුවෙන් වෘත්තීය පුහුණු පාඨමාලා සඳහා තරුණ තරුණියන් යොමු කිරීම.

2014 වර්ෂය තුළ ද මේ යටතේ මූලික අරමුණු ඉටුකර ගැනීම සඳහා විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කෙරේ.

## "ස්වශක්ති" මානව සංවර්ධන වැඩසටහන පිළිබඳව ප්‍රජාව දැනුවත් කිරීම හා ගෘහ මූලික සමීක්ෂණ කටයුතු

- **කොළඹ නාගරික බල ප්‍රදේශය තුළ නව ජනාවාසයන්හි සමාජ – ආර්ථික සමීක්ෂණ කටයුතු සිදු කිරීම**

"ස්වශක්ති" මානව සංවර්ධන වැඩසටහන පිළිබඳව පවුල් දැනුවත් කිරීම හා ස්වශක්ති පවුල් ලියාපදිංචිය හා තොරතුරු ලබා ගැනීම නව ජනාවාසයන්හි තවදුරටත් 2014 වර්ෂය තුළදී සිදුකළ අතර, එහිදී ස්වශක්ති මානව සංවර්ධන වැඩසටහනේ අරමුණු සහ ක්‍රියාකාරකම් පිළිබඳව ජනාවාස ප්‍රජාව දැනුම්වත් කිරීම සිදු කරන ලදි.

ඒ අනුව 2014 වර්ෂයේ කොළඹ නාගරික කලාප 04 ම නියෝජනය වන ලෙස කොළඹ නාගරිකය තුළ ජනාවාස 83 ක පවුල් 2,536 ක් මෙම වැඩසටහන පිළිබඳව දැනුවත් කිරීම හා ගෘහ මූලික සමීක්ෂණ කටයුතු සිදු කරන ලදි.

කොළඹ නාගරික කලාපයෙන් බැහැර ත්‍රිකුණාමලය සමුද්‍රගම ධීවර නිවාස, මොරටුව - අඟුලාන, අවිස්සාවේල්ල - සීතාවකපුර ආශ්‍රිත පවුල් 1,000 කගේ සමාජ - ආර්ථික සමීක්ෂණ කටයුතු සිදු කරන ලදි.






**<u>ප්‍රජා මූල සංවිධාන ශක්තිමත් කිරීම</u>**

"ස්වශක්ති" මානව සංවර්ධන වැඩසටහන ජනාවාස වෙත ප්‍රවේශ වී ශක්තිමත් ප්‍රජා මූල සංවිධාන මෙම වැඩසටහන සඳහා සම්බන්ධ කර ගැනීම සහ ප්‍රජා මූල සංවිධාන අක්‍රිය ජනාවාසයන්හි "ස්වශක්ති" ප්‍රජා සංවර්ධන සමිති ගොඩනැගීම මගින් ශක්තිමත් ප්‍රජා සංවිධාන ව්‍යුහයක් ජනාවාස තුළ ස්ථාපිත කිරීම සිදු කෙරේ. 2014 වර්ෂයේදී ද නව ප්‍රජා මූල සංවිධාන සම්බන්ධ කරගනිමින් කොළඹ නගරයේ "ස්වශක්ති" මානව සංවර්ධන වැඩසටහන දියත් කිරීමට හැකිවිය.

අනුරාධපුර - තුරුඉතුරුගම නිවාස ව්‍යාපෘතියේ පවුල් 100 කගේ සහභාගිත්වයෙන් ස්වශක්ති ප්‍රජා මූල සංවිධාන පිහිටුවන ලදී.







**<u>ප්‍රජා ක්‍රියාකාරින් හා ප්‍රජා නායක නායිකාවන් ඇගයීම</u>**

“ස්වශක්ති” මානව සංවර්ධන වැඩසටහන හා ක්‍රියාකාරීව සම්බන්ධ වී කටයුතු කරන ප්‍රජා නායක නායිකාවන් ඇගයීමේ උළෙලක් කොළඹ මරදාන ටවර් රඟහලේදී පැවැත්විය. එහිදී ප්‍රජා නායක නායිකාවන් 700 කට අධික පිරිසක් මේ අවස්ථාවට සහභාගී වූ අතර, ඔවුන් ඇගයීමට ලක්කරමින් සහතිකපත් ප්‍රදානය සිදු කෙරිණ.

**<u>ළමා කුසලතා, ආකල්ප ප්‍රවර්ධන වැඩසටහන්</u>**

නාගරික ජනාවාස දරුවන්ගේ දැනුම, කුසලතා හා ආකල්ප වර්ධනය කිරීමේ අරමුණින් ස්වශක්ති ළමා සමාජ ගොඩනගමින් ළමා වැඩසටහන් ජනාවාස තුළ ක්‍රියාත්මක කිරීම හා විවිධ ළමා තරඟ, සෞන්දර්ය කුසලතා නංවාලීමේ වැඩසටහන්, රුක් රෝපණ වැඩසටහන්, ඉතිරි කිරීම් හා ආගමික වැඩසටහන්, ළමා පුස්තකාල ආරම්භ කරමින් ජනාවාස දරුවන්ගේ සෑම අංශයක්ම සංවර්ධනය කිරීම වෙනුවෙන් වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සිදුකෙරේ.

2014 වර්ෂයේ නාගරික ජනාවාස දරුවන් වෙනුවෙන් ස්ථාපිත කරන ලද ළමා සමාජ ගණන 50 කි. එම ළමා සමාජ හරහා “ස්වශක්ති” ළමා වැඩසටහන පිළිබඳව නාගරික කලාප 04 ආවරණය වන පරිදි ළමුන් දැනුම්වත් කර ළමුන් 20,000 ක් සම්බන්ධ කර ගන්නා ලදී.





**මතින් තොර නගරයක් - මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන**

මතින් තොර සමාජයක් බිහි කිරීම හා එමගින් රටට අවශ්‍ය නිරෝගීමත් ජනතාවක් බිහිකිරීම රටේ සමාජ, සංස්කෘතික හා ආර්ථික අභිවෘද්ධියට මහත් පිටුවහලක් වේ. විශේෂයෙන් නාගරික අඩු පහසුකම් ජනාවාසවල ළමයින් සහ තරුණයන් මෙම මත් උවදුරෙන් මුදවා ගැනීමට අවශ්‍ය මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන් රාජ්‍ය ආයතන, ස්වේච්ඡා සංවිධාන හා ඒකාබද්ධව ක්‍රියාත්මක කිරීම අරඹන ලදි.

විශේෂයෙන්ම මෙම වැඩසටහන දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය සමඟ ඒකාබද්ධ වී 2011 වර්ෂයේදී අරඹන ලදි. ADIC මත්ද්‍රව්‍ය නිවාරණ ආයතනයේ දායකත්වය මඟින් 2014 වර්ෂයේදී ද නාගරික ජනාවාස ආශ්‍රිතව දැනුම්වත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක විය.





**ඉතුරුම් හා ක්ෂුද්‍ර මූල්‍ය සහායක සේවා වැඩසටහන**

නාගරික ජනාවාස මට්ටමින් දැනට කුඩා පරිමාණ ස්වයං රැකියාවල නිරත ප්‍රතිලාභීන් පිළිබඳ මූලික සමීක්ෂණයක් සිදු කරන ලදි. කොළඹ නාගරික කලාප 04 නියෝජනය වන පරිදි එවැනි ප්‍රතිලාභීන් 34 ක සමීක්ෂණ සිදුකර මූලික ශක්‍යතා අධ්‍යයනයක්ද සිදුකරන ලදි. එහිදී විශේෂයෙන්ම ජනාවාස මට්ටමින් ආහාර නිෂ්පාදනය, කුඩා ව්‍යාපාර, වෙනත් සේවාවන් හා කුඩා පරිමාණ නිෂ්පාදන වැඩි දියුණුකර ගැනීම සඳහා අවශ්‍ය ණය පහසුකම් හා විධිමත් පුහුණුවීම් එම ප්‍රතිලාභීන් ඉල්ලුම් කරන ලදි.

අධිකාරිය මැදිහත්වී එම ප්‍රතිලාභීන් කණ්ඩායම් ගත කර ඉතුරුම් සඳහා පළමුව යොමුකර ඔවුන් දැනට පවත්වාගෙන යන ස්වයං රැකියා ශක්තිමත් කිරීමට අවශ්‍ය දැනුම ලබාදීම, ව්‍යාපාර දියුණු කර ගැනීමට අවශ්‍ය ණය පහසුකම් හි අවශ්‍යතාවයන් පිළිබඳව මූලික තොරතුරු ලබාගන්නා ලදි. කුඩා පරිමාණ වශයෙන් රු. 5,000.00 සිට රු. 15,000.00 දක්වා ව්‍යාපාර දියුණු කර ගැනීමට ප්‍රතිලාභීන් 34 දෙනෙකු සඳහා ණය පහසුකම් ලබාදීම මෙම වර්ෂයේදී සිදු විය. මෙම ක්ෂුද්‍ර මූල්‍ය ණය වැඩසටහනෙහි ණය ආපසු ගෙවීමේ කාලය අවුරුදු 01 කි. පොළී ප්‍රතිශතය 9 % කි.

**ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම**

යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යංශය යටතේ ඇති කොළඹ දිස්ත්‍රික් කුඩා ව්‍යාපාර සංවර්ධන අංශය හා ඒකාබද්ධව සුළු ව්‍යවසායකත්ව ප්‍රවර්ධන වැඩමුළු නාගරික කලාපයන් ආවරණය කරමින් නාගරික ස්වයං රැකියාලාභීන් 250 කට අධික සංඛ්‍යාවකගේ සහභාගීත්වයෙන් පැවැත්විණි.

ව්‍යාපාරයන්හි නිරත වීම පිළිබඳ නිවැරදි දැනුමක් ඉතා සරලව ලබාදී, රාජ්‍ය අනුග්‍රහය සමඟින් ව්‍යාපාරය නිසි ලෙස දියුණු කරගැනීමට අවශ්‍ය අත්වැල මෙමඟින් සපයනු ලබයි.





**ව්‍යවසායකත්ව වැඩසටහන යටතේ මහන මැෂින් ප්‍රදානය**

නාගරික අඩු පහසුකම් ජනාවාසයන්හි ස්වයං රැකියාවන්හි නියුක්ත කාන්තාවන්ට මහන මැෂින් ලබාදීමේ වැඩසටහනක් ඉදිකිරීම්, යන්ත්‍රෝපකරණ හා පුහුණු කිරීමේ මධ්‍යස්ථානයේදී පවත්වන ලදී. ස්වයං රැකියාවන්හි නියුක්ත කාන්තාවන් දිරිගැන්වීම හා ස්වයං රැකියාවන් වැඩිදියුණු කිරීමේ අරමුණින් කාන්තාවන් 75 ක් සඳහා මෙම මහන මැෂින් ප්‍රදානය කිරීම සිදු කරන ලදී.





## රූපලාවන්‍ය පුහුණු පාඨමාලා පැවැත්වීම





නාගරික තරුණ ප්‍රජාවගේ ජීවන තත්ත්වය ඉහළ නංවමින් දැනුම, කුසලතා හා ආකල්පමය වෙනසක් ඇති කිරීම සඳහා ප්‍රජාවගේ දැඩි ඉල්ලීම පරිදි ගාස්තු අයකිරීමකින් තොරව රූපලාවන්‍ය පාඨමාලාවක් ජනාවාස මට්ටමින් පවත්වාගෙන යන ලදී.

වෘත්තීය පුහුණු අධිකාරියේ රූපලාවන්‍ය උපදේශිකාවක විසින් මෙහෙය වූ මෙම රූපලාවන්‍ය පාඨමාලාව යෞවන යෞවනියන් 40 දෙනෙකු පමණ සම්බන්ධ කරගනිමින් උතුරු කොළඹ හා මැද කොළඹ නාගරික කලාප නියෝජනය කරමින් මට්ටක්කුලිය ශ්‍රී වික්‍රමපුර ප්‍රජා ශාලාවේදී ද, බොරැල්ල  නාගරික කලාපය නියෝජනය කරමින් සහස්පුර ප්‍රජා ශාලාවේදී පැවැත්විණි.

## රූපලාවන්‍ය පුහුණු පාඨමාලා හැදෑරූ තරුණියන් වෙත සහතිකපත් ප්‍රදානය

රූපලාවන්‍ය පුහුණු පාඨමාලාව සාර්ථකව නිම කළ තරුණියන් සඳහා ඉදිකිරීම්, යන්ත්‍රෝපකරණ හා පුහුණු කිරීමේ මධ්‍යස්ථානයේදී (ICTAD) සහතික පත් ප්‍රදානය කිරීම සිදු විය.





## ලෝක කාන්තා දිනය සැමරීම

2014 ලෝක කාන්තා දින සැමරීම වස්, නාගරික අඩු පහසුකම් ජනාවාස කාන්තාවන් 1000 කට අධික සහභාගීත්වයෙන් කාන්තා ක්‍රිකට් තරගය, මනමාලියන් දැක්ම,  සූපවේදී වැඩසටහන , සත්ත්ව කුටි ප්‍රදර්ශනය, ළමා හා කාන්තා කාර්යාංශයේ දැනුවත් කිරීම් යන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට අදාළව කාන්තා සමුළුවක් බත්තරමුල්ල ජනකලා කේන්ද්‍රයේ දී පැවැත්විණි.

ඊට අදාළ 2014 ලෝක කාන්තා දින වැඩසටහන මෙවර නවගම්පුර ප්‍රජා ශාලාවේ දී පැවැත්විණි. රූපලාවන්‍ය පාඨමාලාව සාර්ථකව හැදෑරූ තරුණියන් 20 දෙනෙකු තමා ලබාගත් දැනුම හා අත්දැකීම් පදනම් කරගෙන ඔවුන්ගේ ස්වයං නිර්මාණයක් ලෙස 2014 ලෝක කාන්තා දින වැඩසටහන සඳහා මනාලියන් දැක්මක් ඉදිරිපත් කරන ලදී. ස්වයං රැකියාවන්හි නියුක්ත වූවන් දිරිගැන්වීම සඳහා අලෙවි කුටි ඉදිකරමින් තම නිෂ්පාදනයන් අලෙවි කිරීමේ අවස්ථාව ද උදාවිය.





**<u>ප්‍රජා සහභාගීත්ව සනීපාරක්ෂක භෞතික ව්‍යාපෘති වැඩසටහන</u>**

නාගරික ජනාවාස ආශ්‍රිතව අත්‍යවශ්‍යයෙන්ම සංවර්ධනය කළ යුතු පොදු පහසුකම් සංවර්ධනය කරදීම මෙම වැඩසටහනේ අරමුණය. මෙම ප්‍රජාව වෙනුවෙන් ක්‍රමවත් නිවාස පහසුකම් සපයන තෙක් මෙම ජනාවාසවල පොදු වශයෙන් පවතින වැසිකිළි පහසුකම්, මළාපවාහන පද්ධති, කාණු පද්ධති, ප්‍රජාශාලා ක්‍රීඩා, විවේක ස්ථාන හා පුස්තකාල සංවර්ධනය කරදීම මෙම වැඩසටහන යටතේ ක්‍රියාත්මකයි. 2014 වර්ෂයේ ප්‍රජා ව්‍යාපෘති 54 ක් ඉදිකිරීම් සඳහා හඳුනාගෙන ඇත.









**<u>ප්‍රජා සමිති වෙත භාණ්ඩ හා උපකරණ ලබාදීම</u>**





ඌන පහසුකම් සහිත නාගරික ජනාවාසයන්හි ක්‍රියාත්මක ප්‍රජා සමිති වෙත පුටු, කබඩ් ආදී උපකරණ ලබාදීම ඉදිකිරීම්, යන්ත්‍රෝපකරණ හා පුහුණු කිරීමේ මධ්‍යස්ථානයේදී (ICTAD) සිදු විය.

**<u>ශ්‍රමදාන වැඩසටහන් පැවැත්වීම</u>**





තම නිවෙස් අවට පරිසරය මෙන්ම ජනාවාසය ද පිරිසිදුව තබාගැනීමට ප්‍රජාව පෙළඹවීමේ අරමුණින් ශ්‍රමදාන වැඩසටහන් ජනාවාස මට්ටමින් පැවැත්වීමට කටයුතු කරනු ලැබේ. ප්‍රජා සහභාගීත්වයෙන් පොදු ස්ථාන, කාණු වැනි තැන් පිරිසිදු කිරීමත්, ප්‍රජාව පිරිසිදු වටපිටාවක ජීවත්වීමට හුරුකරවීමත් මෙමඟින් සිදු වේ.

**<u>ග්‍රෑන්ඩ්පාස් ස්ටේස්පුර ක්‍රීඩාංගණය අලුත්වැඩියා කර ජනතා අයිතියට පත් කිරීම</u>**





2014 ලෝක ජනාවාස දිනට සමගාමීව ස්ටේස්පුර ක්‍රීඩාංගණය, දිවා - රාත්‍රී තරඟ පැවැත්වීමට හැකිවන පරිදි විදුලි ආලෝකය සහ අනෙකුත් ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කරමින් ජනතා අයිතියට පත් කෙරිණි. විවෘත කිරීමේ උත්සවයේදී පාපන්දු කණ්ඩායම් 10 කගේ සහභාගීත්වයෙන් ප්‍රදර්ශනාත්මක තරගයක් පවත්වන ලදි.

**<u>2014 ලෝක ජනාවාස දින සමාරම්භක උළෙල</u>**

2014 වසරේ ලෝක ජනාවාස දිනය අරමුණු කරගනිමින් "කොළඹ ළමයි " තේමාව යටතේ ළමා වැඩසටහන් ආරම්භ කිරීමට කටයුතු කළ අතර, එහි සමාරම්භක උත්සවය 2014 පෙබරවාරි 22 දින සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය හා ඒකාබද්ධ වෙමින් පැලවත්ත "අපේ ගම" (ජන කලා කේන්ද්‍රය) දී ළමුන් 2,500 කගේ සහභාගීත්වයෙන් පැවැත්විණි.

එහිදී කොළඹ නාගරික කලාපයේ හා තදාසන්න නාගරික කලාපවල අඩු පහසුකම් දරුදැරියන්ගේ සෞන්දර්ය කුසලතා නංවාලීම උදෙසා සෞන්දර්ය විශ්වවිද්‍යාලයේ විද්‍යාර්ථීන් සම්බන්ධ කරගනිමින් ජනාවාස දරුදැරියන් හට ගායනා, නර්තන, මූර්ති වැනි සෞන්දර්ය අංශයන් පිළිබඳ මූලික දැනුම ලබා දෙන ලදි.





**<u>ජනාවාස දිනය ඉලක්ක කරගනිමින් ළමා චිත්‍ර, ගායනා, නර්තන පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම</u>**

චිත්‍ර, ගායනා හා නර්තන තරඟයන්ට ඉදිරිපත් වන සියලුම ජනාවාස දරුවන් සම්බන්ධ කරගනිමින් අප්‍රේල් මස සිට අඛණ්ඩව සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ දෘශ්‍ය කලා පීඨයේ කථිකාචාර්යවරුන් සහ විද්‍යාර්ථීන් සම්බන්ධ කරගනිමින් පුහුණු වැඩසටහන් නාගරික ජනාවාසයන්හි පොදු ස්ථානවල පවත්වන ලදි.





## සංස්කෘතික ප්‍රසංගය සඳහා පෙර පුහුණුවීම්

නෙළුම් පොකුණ ජාත්‍යන්තර රඟහලේදී පැවැත්වූ සංස්කෘතික ප්‍රසංගය සඳහා පෙර පුහුණුවීම් කටයුතු ළමුන් 500 කට අධික ප්‍රමාණයකගේ සහභාගීත්වයෙන්, සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ සම්පත් දායකත්වයෙන් සිදු කෙරිණි. මෙම අවස්ථාව ළමුන් සතු දක්ෂතාවයන් හා කුසලතාවයන් එළිදැක්වීමේ මහඟු තෝතැන්නක් විය.





## ''කොළඹ ළමයි'' ළමා සංස්කෘතික ප්‍රසංගය

2014 ඔක්තෝබර් මස 04 වන දින ජනාවාස දරුවන් 700 කට ආසන්න සංඛ්‍යාවක් සහභාගී කරගනිමින් ළමා සංස්කෘතික ප්‍රසංගයක් නෙළුම් පොකුණ රඟහලේදී පවත්වන ලදී. ඒ සඳහා විවිධ නිර්මාණයන් ඉදිරිපත් කළ අතර, පෙර පුහුණුවීම් ප්‍රවීණයන්ගේ අධීක්ෂණය යටතේ සිදු විය.

ප්‍රසංග පිටපත හා අධ්‍යක්ෂණය අමිත්ත වීරසිංහයන් විසින් ද, සංගීත අධ්‍යක්ෂණය නවරත්න ගමගේ මහතා, අංග රචනය වසන්ත විට්ටච්චි මහතා, ඇඳුම් නිර්මාණය සුවිනීතා පෙරේරා මහත්මිය සහ අමා විජේසේකර මෙනෙවිය වැනි ප්‍රවීණයන්ගෙන් සැදුම්ලත් කණ්ඩායමක් මඟින් සිදු කෙරිණි.

"ස්වශක්ති " මානව සංවර්ධන වැඩසටහන හා සම්බන්ධ සමස්ත ළමුන් අතරින් තෝරාගත් ගායන, නර්තන, නාට්‍ය හා චිත්‍ර අංශයන්ට දක්ෂතා ඇති දරුදැරියන් සම්බන්ධ කරගනිමින් පුහුණුවීම් කටයුතු සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ කථිකාචාර්යවරුන්, විද්‍යාර්ථීන් හා කලා ක්ෂේත්‍රයේ ප්‍රවීණයන්ගේ උපදේශකත්වයෙන් සිදු කෙරිණි.














## ලෝක ජනාවාස දිනය සැමරීම – 2014

ලෝක ජනාවාස දිනය සැමරීම නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය වෙත පනතින් පැවරී ඇති විධිවිධානයන්ට අනුව ලෝක ජනාවාස දින ශ්‍රී ලංකාවේ සැමරුම සම්බන්ධයෙන් වැදගත් කාර්යභාරයක් ඉටු කිරීමේ වගකීම අප අධිකාරිය වෙත පැවරී ඇත.

ඒ අනුව, ජනාවාස මට්ටමින් පැවති චිත්‍ර, නාට්‍ය, ක්‍රිකට් තරංගයන් අතුරින් ජයග්‍රහණය කළ දරුදැරියන් හට තිළිණ, සහතිකපත්, කුසලාන පිරිනැමීම 2014 ඔක්තෝම්බර් මස 06 වන දින කොළඹ සුගතදාස ගෘහස්ථ ක්‍රීඩාංගනයේදී අතිගරු ජනාධිපතිතුමන්ගේ ප්‍රධානත්වයෙන් පැවති ජනාවාස දින ජතික උත්සවයේදී සිදු කරන ලදී.

### <u>නාගරික ජනාවාස දරුවන්ගේ ළමා සිතුවම්කරණ තරගය - පළමු වටය</u>

නාගරික ජනාවාස දරුවන්ගේ නිර්මාණාත්මක හැකියාවන් හා කලා කුසලතා වර්ධනය කිරීමේ අරමුණින් 2014 අගොස්තු මස පළමු සතියේ සිට චිත්‍ර තරංගය ජනාවාස මට්ටමින් පැවැත්වූ අතර, ප්‍රජා ක්‍රියාකාරීන් හා ප්‍රජා නායකයින් හරහා මෙම තරග සංවිධානය කරන ලදී. ඒ සඳහා කොළඹ නාගරික කලාපයේ ජනාවාස දරුවන් 13,000 කට ආසන්න සංඛ්‍යාවක් ඒකරාශී කරගනිමින් වයස් කාණ්ඩ 03ක් යටතේ ළමා චිත්‍ර තරංගයක් ලෝක ජනාවාස දිනය අරමුණු කර ගනිමින් පවත්වනු ලැබීය.





පළමු වටය සඳහා ඉදිරිපත් වූ ළමුන්ගේ වඩාත් සාර්ථක නිර්මාණ 5000ක් තෝරා සජීවීව චිත්‍ර නිර්මාණය කිරීම සැප්තැම්බර් මස 20 වන දින විහාර මහා දේවි උද්‍යානයේදී පැවැත්විණි.

**<u>නාගරික ජනාවාස දරුවන්ගේ ළමා සිතුවම්කරණ තරඟය - අවසන් වටය</u>**

2014.09.20 වන දින කොළඹ විහාර මහාදේවි උද්‍යාන පරිශ්‍රයේදී පළමු අදියරෙන් තෝරාගත් ළමුන් 5,000 ක් සම්බන්ධ කරගනිමින් සජීවීව චිත්‍ර නිර්මාණය කිරීම සිදු විය. මෙහිදී සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ විද්‍යාර්ථීන් 50 දෙනෙකු සහායක කණ්ඩායමක් ලෙස අප හා සම්බන්ධ විය.









## "ස්වශක්ති" ළමා සිතුවම් ඇක්ම

අවසන් අදියරේ චිත්‍ර නිර්මාණය සඳහා සම්බන්ධ වූ දරුවන් අතරින් කුසලතාවය ඇති චිත්‍ර 600 ක් ප්‍රදර්ශනයක් ලෙසින් ඉදිරිපත් කිරීම 2014 ඔක්තෝම්බර් මස 01, 02 හා 03 යන තෙදින තුළ කොළඹ කලාභවනේ දී ප්‍රදර්ශනය කිරීම සිදු විය.

ජයග්‍රහණ ලැබූ දරුවන් වෙත තිළිණ, සහතිකපත්, සම්මාන හා මුදල් ත්‍යාග ලබාදීම 2014 ඔක්තෝම්බර් මස 06 වන දින කොළඹ සුගතදාස ගෘහස්ථ ක්‍රීඩාංගනයේදී අතිගරු ජනාධිපතිතුමන්ගේ ප්‍රදානත්වයෙන් පැවති ජනාවාස දින ජාතික උත්සවයේදී සිදු කරන ලදී.









## නාගරික ජනාවාස දරුවන්ගේ කුසලතා වර්ධනය උදෙසා ළමා කෙටි නාට්‍ය තරඟය

නාගරික අඩු ආදායම්ලාභී දරු පවුල්හි ළමා නිර්මාණ හැකියාවන් වර්ධනය කිරීම සඳහා 2014 ලෝක ජනාවාස දිනය නිමිත්තෙන් නාගරික ජනාවාස ආශ්‍රිත ආර්ථික, සමාජීය හා වෙනත් විසඳුම් සෙවීම අර්ථවත් කරමින් ළමා නාට්‍ය තරඟයක් අප අධිකාරිය විසින් සංවිධානය කරනු ලැබීය.

නාට්‍ය තරඟය සඳහා ඉදිරිපත් වූ සියලුම කණ්ඩායම් සඳහා සෞන්දර්ය විශ්වවිද්‍යාලයේ කථිකාචාර්යවරුන් හා විද්‍යාර්ථීන් සම්බන්ධ කරගනිමින් ජූලි මස සිට පෙර පුහුණුවීම් කටයුතු සිදු කරන ලදී.

මෙම නාට්‍ය තරඟය සඳහා කොළඹ නාගරිකය ආවරණය වන අයුරින් පළමු වටය සඳහා නාට්‍ය කණ්ඩායම් 63 ක් ඉදිරිපත් විය. නාට්‍ය ක්ෂේත්‍රයේ ප්‍රවීණයන්ගෙන් සමන්විත විනිශ්චය මණ්ඩලයක් තුළින් නාට්‍ය 27 (ළමුන් 400) ක් අවසන් වටය සඳහා තෝරාගනු ලැබූ අතර, එම නාට්‍ය වඩාත් නිර්මාණශීලි නිෂ්පාදනයක් බවට පත් කිරීම අරමුණුකොට විශේෂ නාට්‍ය වැඩමුළුවක් ද සංවිධානය කරන ලදි.

එසේ දෙවන වටය සඳහා තෝරාගනු ලැබූ නාට්‍ය 2014 සැප්තැම්බර් මස 28 සහ 29 වන දින කොළඹ ග්‍රීන්පාත් නවනගර ශාලාවේදී ප්‍රදර්ශනය කරනු ලැබිණි. එම නාට්‍ය උළෙලේදී ජයග්‍රාහී නාට්‍ය මෙන්ම ශිල්පීන් ද තෝරාගනු ලැබූ අතර, ජයග්‍රහණ සඳහා වූ ත්‍යාග හා සහතික පත් ප්‍රදානය කිරීම 2014 ඔක්තෝම්බර් මස 06 වන දින කොළඹ සුගතදාස ගෘහස්ථ ක්‍රීඩාංගනයේදී අතිගරු ජනාධිපතිතුමන්ගේ ප්‍රධානත්වයෙන් පැවති ජනාවාස දින ජාතික උත්සවයේදී සිදු කරන ලදි.





**<u>2014 ක්‍රීඩා කුසලතා ප්‍රවර්ධනය - සය සාමාජික සැහැල්ලු පන්දු ක්‍රිකට් තරගාවලිය (කාන්තා /පිරිමි)</u>**

**<u>පළමු වටය</u>**

කොළඹ නාගරික අඩු පහසුකම් සහිත ජනාවාසයන්හි තරුණ තරුණියින්ගේ ක්‍රීඩා කුසලතාවයන් වර්ධනය කිරීමේ අරමුණින් හා 2014 ලෝක ජනාවාස දිනය නිමිත්තෙන් සය සමාජික සැහැල්ලු පන්දු ක්‍රිකට් තරගාවලියක් (කාන්තා /පිරිමි) සංවිධානය කරන ලදි.

මෙම තරගයන්හි පළමු වටය 2014 අගෝස්තු මස 25, 26, 29 හා සැප්තැම්බර් මස 02 හා 10 දිනයන්හි ශාලිකා ක්‍රීඩාංගනය, බණ්ඩාරනායකපුර ක්‍රීඩාංගනය, ශ්‍රී වික්‍රමපුර ක්‍රීඩාංගනයේදී හා බේස්ලයින් පාර දුම්රිය ක්‍රීඩාංගණයේදී පැවැත් වූ අතර, කණ්ඩායම් 150 ක් (තරුණ තරුණියන් 1,200 ක්) මේ සඳහා සහභාගී විය.





## 2014 ක්‍රීඩා කුසලතා ප්‍රවර්ධනය - සය සාමාජික සැහැල්ලු පන්දු ක්‍රිකට් තරඟාවලිය (කාන්තා /පිරිමි)

### අවසාන වටය

පළමු වටයෙන් තෝරාගනු ලැබූ ජයග්‍රාහී කණ්ඩායම් 20 ක් (කාන්තා හා පිරිමි) 2014 සැප්තැම්බර් මස 28 දින රාජගිරිය බණ්ඩාරනායකපුර ක්‍රීඩාංගනයේදී තරඟ වැදුණු අතර, ජයග්‍රාහකයින් සඳහා ත්‍යාග සහ සහතිකපත් ප්‍රදානය 2014 ඔක්තෝම්බර් මස 06 වන දින කොළඹ සුගතදාස ගෘහස්ථ ක්‍රීඩාංගනයේදී අතිගරු ජනාධිපතිතුමන්ගේ ප්‍රදානත්වයෙන් පැවති ජනාවාස දින ජාතික උත්සවයේදී සිදු කරන ලදී.













### විදි ආහාර සැණකෙළිය පිළිබඳ පූර්ව දැනුවත් කිරීම





උතුරු කොළඹ, මැද කොළඹ, නැගෙනහිර /බටහිර කොළඹ හා බොරැල්ල යන කලාප ආවරණය වන පරිදි ප්‍රජා ක්‍රියාකාරීන් 26 දෙනෙකුගේ නායකත්වය යටතේ වීදි ආහාර නිෂ්පාදය හා අලෙවියේ යෙදෙන පුද්ගලයින් 400 ක් පමණ "කොළොම්පුර වීදි ආහාර නිෂ්පාදනය හා අලෙවි කරන්නන්ගේ සංගමය" යටතේ සංවිධානය වූ අතර, නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියේ නිලධාරීන් හා ප්‍රජා නායකයින් හා ක්‍රියාකාරීන්ගේ සහභාගීත්වයෙන් වීදි ආහාර නිෂ්පාදන හා අලෙවි ප්‍රවර්ධන වැඩසටහනක් නිර්මාණය කිරීම සම්බන්ධයෙන් 2014.10.31 දින බොරැල්ල මැගසින් ප්‍රජා ශාලාවේදී මූලික සාකච්ඡාවක් පැවැත්වූ අතර, කලාප 04 තුළ අවස්ථා කිහිපයකදී ඒ පිළිබඳ දැනුවත් කිරීමේ ක්‍රියාකාරකම් සිදු කරන ලදී.

නාගරික ජනාවාසයන්හි ආහාර නිෂ්පාදනය කරනු ලබන කුඩා පරිමාණ ස්වයං රැකියාලාභීන් ප්‍රවර්ධනය කිරීම උදෙසා සංවිධානය කරන ලද වීදි ආහාර සැණකෙළිය ඔක්තෝබර් මස 01, 02 හා 03 යන දිනයන්හි ග්‍රීන්පාත් මාර්ග පරිශ්‍රයේදී පැවැත්විණි.










## ගෑස් සිලින්ඩර් සහ ගෑස් උදුන් ලබාදීම





ආහාර අලෙවියේ යෙදෙන ව්‍යවසායකයින් 135 දෙනෙකු සඳහා ගෑස් සිලින්ඩර් සහ ගෑස් උදුන් ප්‍රදානය කිරීම 2014 ඔක්තෝබර් මස 01 වන දින විහාර මහා දේවි උද්‍යානයේ එළිමහන් රංග පීඨයේදී සිදු කෙරිණ. වීදි ආහාර අලෙවියේ යෙදෙන ස්වයං රැකියාලාභීන් දිරිමත් කිරීමත්, ඔවුන්ට සහායක් ලෙස මෙම ප්‍රදානයන් සිදු කරන ලදී.

# නාගරික ජනාවාස සවර්ධන අධිකාරිය 2014/12/31 න් අවසන් වසර සඳහා මූල්‍ය ප්‍රකාශන

1) මූල්‍ය තත්ත්ව ප්‍රකාශය
2) ආදායම් හා වියදම් ගිණුම
3) මුදල් ප්‍රවාහ ප්‍රකාශය
4) ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය

නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය

**2014 දෙසැම්බර් 31 දිනට**

මූල්‍ය තත්ව ප්‍රකාශය

| | සටහන | 2014 | 2013 |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| **ජංගම වත්කම්** | | | |
| මුදල් හා බැංකු ශේෂය | **01** | 81,041,114.83 | 93,992,917.10 |
| තොග- සම්පත් මධ්‍යස්ථාන සඳහා | **02** | 11,441,401.85 | |
| අත්තිකාරම් | **03** | 290,404.00 | 171,780.00 |
| කාර්ය මණ්ඩල ණය | | 7,466,185.85 | 8,294,237.96 |
| සුභ සාධක ණය | | 10,000.00 | - |
| රීල් සමාගම | | 12,100,000.00 | 13,103,674.00 |
| ලැබිය යුතු දෑ | **04** | 16,741,364.25 | 6,235,456.34 |
| කොන්ත්‍රාත් අත්තිකාරම් | **05** | 170,562,116.84 | 259,824,529.27 |
| | | **299,652,587.62** | **381,622,594.67** |
| **ජංගම නොවන වත්කම්** | | | |
| නිවාස ණය | **06** | 124,192,218.57 | 38,155,965.87 |
| නොනිමි ව්‍යාපෘති | **07** | 1,775,592,625.62 | 1,073,530,511.93 |
| දේපල පිරියත හා උපකරණ | **08** | 12,970,151.34 | 15,210,611.60 |
| 48 වත්ත නිවාස ව්‍යාපෘතිය (නිවාස 14) | | 34,500,000.00 | - |
| තුරුඉතුරුගම නිවාස ව්‍යාපෘතිය (නිවාස 8) | | 6,328,507.81 | 85,434,855.31 |
| | | **1,953,583,503.34** | **1,212,331,944.71** |
| **මුළු වත්කම්** | | **2,253,236,090.95** | **1,593,954,539.37** |
| **වගකීම්** | | | |
| **ජංගම වගකීම්** | | | |
| උපචිත වියදම් | **09** | 242,944,312.78 | 155,557,145.04 |
| කළමනාකරණ සංස්ථා අරමුදල | | 7,830,000.00 | - |
| රඳවාගත් මුදල් | **10** | 44,179,170.33 | 43,774,968.40 |
| නිවාස සංවර්ධන අධිකාරිය | **11** | | |
| | | 2,959,364.16 | |
| අඟුලාන කුලී අත්තිකාරම් | | 8,250,000.00 | |
| | | **306,162,847.27** | **199,332,113.44** |
| **ජංගම නොවන වගකීම්** | | | |
| පාරිතෝෂික සඳහා වෙන්කිරීම් | | 5,738,637.50 | 4,605,240.63 |
| | | **5,738,637.50** | **4,605,240.63** |
| **මුළු වගකීම්** | | **311,901,484.77** | **203,937,354.07** |
| **ශුද්ධ වත්කම්** | | **1,941,334,606.19** | **1,390,017,185.30** |
| **ස්කන්ධය හා සංචිත** | | | |
| භාණ්ඩාගාර ප්‍රධාන | **12** | 1,878,411,960.70 | 1,408,558,466.22 |
| අදායම් සංචිත | | 93,094,358.50 | |
| | | **1,971,506,319.20** | 1,408,558,466.22 |
| සමුච්චිත අරමුදල | | (19,887,113.92) | (24,574,155.13) |

| | | | |
|---|---|---|---|
| වසර සඳහා ඌණතාවය | | (10,284,599.09) | 6,032,874.21 |
| | | **(30,171,713.01)** | **(18,541,280.92)** |
| **මුළු ස්කන්ධය** | | **1,941,334,606.19** | **1,390,017,185.30** |
| | | | |

පිටු අංක 03 හා 04 හි දැක්වෙන ගිණුම්කරණ ප්‍රතිපත්ති හා පිටු අංක 09 සිට 11 දක්වා දැක්වෙන සටහන් මූල්‍ය ප්‍රකාශන කට්ටලයේ මූලිකාංගයකි. අවසන් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම, නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියේ කළමනාකරණ මණ්ඩලයේ වගකීම වේ. මෙම මූල්‍ය ප්‍රකාශන සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය හිමිව තිබෙන අතර ඔවුන් වෙනුවෙන් අත්සන් කරන ලදි.

| | | |
|---|---|---|
| ................................. | ....................................... | .......................................... |
| අධ්‍යක්ෂ (මුදල්) | අධ්‍යක්ෂ ජනරාල් | සභාපති |
| නා.ජ.සං.අ. | නා.ජ.සං.අ. | නා.ජ.සං.අ. |

නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය

**2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**

**ආදායම් හා වියදම් ගිණුම**

| | සටහන | **2014** | **2013** |
|---|---|---|---|
| **<u>ආදායම්</u>** | | | |
| නිවාස අමාත්‍යාංශය | | 49,136,399.70 | 28,240,483.90 |
| භාණ්ඩාගාර ප්‍රධාන | | 67,000,000.00 | 55,158,000.00 |
| පොළී අදායම් | **13** | 8,287,240.82 | 6,928,216.76 |
| වෙනත් අදායම් | **14** | 1,677,350.82 | 829,382.67 |
| අභුලාන අදායම | | - | 9,900,000.00 |
| 187 වත්ත | | - | 200,000.00 |
| ප්‍රජා සංවිධාන | | - | 3,741,000.00 |
| **මුළු අදායම්** | | **126,100,991.34** | **104,997,083.33** |
| | | | |
| **<u>වියදම්</u>** | | | |
| **<u>පරිපාලන වියදම්</u>** | | | |

| | | | |
|---|---|---|---|
| වැටුප් | | 33,652,379.26 | 29,843,026.80 |
| අතිකාල දීමනා | | 2,749,329.60 | 1,783,320.52 |
| වෙනත් දීමනා | | 2,889,803.52 | 1,612,177.00 |
| ප්‍රසාද දීමනා | | 1,335,000.00 | 1,150,000.00 |
| අධ්‍යක්ෂක මණ්ඩල දීමනා | | 897,460.00 | 974,000.41 |
| ගමන් වියදම් | | 629,771.00 | 321,717.00 |
| විදේශ ගමන් වියදම් | | 2,211,339.47 | 2,327,781.31 |
| ලිපි ද්‍රව්‍ය | | 2,310,209.87 | 1,246,239.37 |
| ඉන්ධන | | 2,290,876.10 | 1,961,315.69 |
| සුභසාධන වියදම් | | 629,909.00 | 942,272.00 |
| පුවත්පත් | | 35,125.00 | 34,345.00 |
| මුද්දර | | 80,305.00 | 74,207.00 |
| බැංකු වියදම් | | 15,000.00 | 15,375.00 |
| දුරකථන වියදම් | | 1,441,799.26 | 835,944.70 |
| කාර්යාල කුලි වියදම් | | 6,914,421.64 | 5,579,506.20 |
| අළුත්වැඩියා හා නඩත්තු(කාර්යාලීය උපකරණ) | | 471,299.21 | 384,686.40 |
| වාහන අලුත්වැඩියාව හා නඩත්තු කිරීම් | | 2,087,204.23 | 2,967,173.41 |
| ගොඩනැගිලි අලුත්වැඩියාව හා නඩත්තු කිරීම | | 352,476.50 | 12,499.30 |
| ගොඩනැගිලි ප්‍රතිසංස්කරණ | | 3,451,546.86 | |
| රක්ෂණ වියදම් | | 471,781.70 | 513,211.40 |
| පිරිසිදු කිරීම | | 376,875.00 | 228,015.00 |
| පුහුණු වැඩසටහන් සඳහා වියදම් | | 493,850.00 | 461,833.34 |
| මුද්‍රණ වියදම් | | 1,018,633.90 | 660,481.00 |
| පරිභෝජන අයිතම මිලදී ගැනීම | | 38,167.00 | 73,385.00 |
| ප්‍රචාරණ | | 244,093.00 | 349,260.80 |
| වෙනත් වියදම් ද්‍රව්‍ය | | 26,924.00 | 166,654.69 |
| වෙනත් වියදම් සේවා | | 135,558.72 | 362,258.00 |
| විගණන ගාස්තු | | 115,320.00 | - |
| සේ.අ.සා අරමුදල | | 8,922,837.38 | 6,148,256.46 |
| සේ.භා.අරමුදල | | 1,337,258.87 | 922,836.26 |
| ආරක්ෂක වියදම් | | 289,000.00 | 310,553.00 |
| පාරිතෝෂික | | 1,499,716.87 | 784,415.38 |
| විදුලි වියදම් | | 136,298.26 | 175,713.38 |
| ජල බිල්පත් | | 181,484.06 | 116,034.20 |
| සංග්‍රහ වියදම් | | 8,710.00 | - |
| වෛද්‍ය වියදම් | | 2,500.00 | - |
| දැයට කිරුළ | | 208,800.00 | - |
| විසිරි නිවාස ණය එකතු කිරීමේ කොමිස් | | 143,690.70 | - |
| නීති වියදම් | | | 120,300.00 |
| තිකුණාමලය විවිධ වියදම් | | | 2,000.00 |
| ප්‍රදර්ශන වියදම් | | | 946,321.00 |
| ලී බඩු හා සවිකිරීම් නඩත්තුව හා අලුත්වැඩියාව | | | 1,350.00 |

| | | | |
|---|---|---|---|
| ක්ෂය | **08** | 2,389,984.05 | 6,515,240.59 |
| | | **82,486,739.03** | **70,923,706.61** |
| **<u>සංවර්ධන වියදම්</u>** | | | |
| සිංහපුර නිවාස ව්‍යාපෘතිය | | 3,617,773.33 | 71,156.00 |
| ස්වශක්ති ප්‍රජාසමිති ඉදිකිරීම් | | 5,174,563.71 | 1,505,018.11 |
| සහස්පුර නිවාස ප්‍රතිසංස්කරණ | | 343,750.00 | 4,515.69 |
| ජනාවාස දිනය | | 24,074,474.18 | 6,494,553.00 |
| උත්සව වියදම් | | 14,000.00 | 4,828,670.06 |
| ප්‍රවාහන වියදම් | | 5,404,151.55 | 7,060,430.00 |
| ස්වශක්ති මානව සංවර්ධන | | 15,261,553.63 | 5,931,036.67 |
| අනුරාධපුර නිවාස ව්‍යාපෘතිය | | 8,585.00 | 2,145,122.98 |
| | | **53,898,851.40** | **28,040,502.51** |
| **මුළු වියදම** | | **136,385,590.43** | **98,964,209.12** |
| **කලච්චේදය සඳහා ඌණතාවය** | | **(10,284,599.09)** | **6,032,874.21** |

**නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය**

**2014 දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය සඳහා**

**මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

| | 2014 | 2013 |
|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරම්** | | |
| **<u>ලැබීම්</u>** | | |
| භාණ්ඩාගාර ප්‍රධාන (පුනරාවර්තන) | 67,000,000.00 | 55,158,000.00 |
| වෙනත් අදායම් | 951,470.00 | 2,828,948.90 |
| පොළී අදායම් | 2,219,950.61 | 2,177,927.52 |
| අපදා ණය අයවීම | 798,580.96 | |
| කුලී අදායම් | 315,000.00 | 220,000.00 |
| ටෙන්ඩර් ගාස්තු | | 51,000.00 |
| | 71,285,001.57 | 60,435,876.42 |
| **<u>ගෙවීම්</u>** | | |
| වැටුප් හා වෙනත් දීමනා | 52,666,392.31 | 51,049,779.49 |
| ගමන් වියදම් | 2,808,721.97 | 2,811,890.16 |

| | | |
|---|---|---|
| සේවා | 4,923,098.65 | 3,029,485.98 |
| ගිවිසුම්ගත සේවා | 19,816,337.97 | 15,635,271.79 |
| නඩත්තු වියදම් | 7,042,858.38 | 3,935,255.18 |
| මුදල් අත්තිකාරම් | 67,839.00 | |
| | 87,325,248.28 | 76,461,682.60 |
| | | |
| **මෙහෙයුම් ක්‍රියාකාරම් වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය** | **(16,040,246.71)** | **(16,025,806.18)** |
| **ආයෝජන ක්‍රියාකාරම්** | | |
| **<u>ලැබීම්</u>** | | |
| නිවාස සංවර්ධන අධිකාරිය - සහස්පුර ප්‍රතිසංස්කරණ | 31,141,388.49 | 13,761,693.79 |
| විසිරි නිවාස ණය වාරික | 3,833,684.86 | 6,715,438.51 |
| ලැබූ අරමුදල් - රීල් | 1,003,674.00 | |
| අඟුලාන නිවාස ව්‍යාපෘතිය සඳහා ලැබූ අරමුදල් | | 9,900,000.00 |
| අනුරාධපුර කටුකැලියාව නිවාස ව්‍යාපෘති වාරික | 246,000.00 | 437,051.00 |
| ස්වශක්ති වාරික | 232,710.32 | 593,771.20 |
| | 36,457,457.67 | 31,407,954.50 |
| **<u>ගෙවීම්</u>** | | |
| අඟුලාන ව්‍යාපෘතිය | 241,357,521.01 | 321,335,244.02 |
| ලුනාව ව්‍යාපෘතිය | 197,901,493.05 | 190,712,228.46 |
| තලවකැලේ ව්‍යාපෘතිය | 40,957,707.24 | 4,345,156.63 |
| හලාවත ව්‍යාපෘතිය | 47,510,561.35 | 3,882,147.77 |
| සීතාවක ව්‍යාපෘතිය | 1,514,682.50 | - |

| | | |
|---|---|---|
| ත්‍රිකුණාමල ව්‍යාපෘතිය | 738,354.49 | - |
| අනුරාධපුර ව්‍යාපෘතිය | | 8,217,791.57 |
| සහස්පුර ප්‍රතිසංස්කරණ | 28,525,774.33 | 13,763,923.79 |
| ස්ථාවර වත්කම් මිලට ගැනීම් | 4,176,057.60 | 1,409,483.20 |
| මානව සංවර්ධන වියදම් | 47,584,974.09 | 15,753,155.61 |
| 48 වත්ත | 4,520,948.75 | 8,072,738.00 |
| විසිරි නිවාස ණය | 21,425,000.00 | 6,947,500.00 |
| | 636,213,074.41 | 574,439,369.05 |
| **ආයෝජන ක්‍රියාකාරම් වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය** | **(599,755,616.74)** | **(543,031,414.55)** |
| **මූල්‍ය කටයුතු** | | |
| භාණ්ඩාගාර ප්‍රධාන (ප්‍රාග්ධන වියදම්) | 596,664,061.18 | 599,204,466.22 |
| අඟුලාන කළමනාකරණ සංස්ථා අරමුදල | 6,180,000.00 | |
| **මූල්‍ය ක්‍රියාකාරම් වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය** | **602,844,061.18** | **599,204,466.22** |
| මුදල් හා මුදල් හා සමාන දේ වල ශුද්ධ වැඩිවීම / (අඩුවීම) | (12,951,802.27) | 40,147,245.49 |
| වසර ආරම්භයේ මුදල් හා මුදල් හා සමාන දේ | 93,992,917.10 | 53,845,671.61 |
| වසර අවසානයේ මුදල් හා මුදල් හා සමාන දේ | **81,041,114.83** | **93,992,917.10** |

**සටහන - මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

31/12/2014 දින මුදල් පොතේ ශේෂය

| | |
|---|---|
| ලංකා බැංකුව බත්තරමුල්ල (පුනරාවර්තන) | 1,237,936.65 |
| ලංකා බැංකුව බත්තරමුල්ල (ප්‍රාග්ධන) | 27,810,011.23 |
| ලංකා බැංකුව බත්තරමුල්ල (අනුරාධපුර) | 254,445.26 |
| ලංකා බැංකුව බත්තරමුල්ල (නාගරික ජනාවාස ප්‍රවර්ධන වැඩසටහන) | 16,450.39 |
| ඉතිරි කිරීම් ගිණුම | 44,107,167.68 |
| ඉතිරි කිරීම් ගිණුම-කළමනාකරණ සංස්ථා අරමුදල | 7,615,103.62 |
| | **81,041,114.83** |

**නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය**

**31/12/2014 දිනෙන් අවසන් වර්ෂය සඳහා ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය**

| විස්තරය | ප්‍රාග්ධන | සමුච්ත අරමුදල | රාජ්‍ය ප්‍රධාන | රැඳවූ අරමුදල් | අදායමට එරෙහිව කපාහැරීම | එකතුව |
|---|---|---|---|---|---|---|
| 2014/01/01 ශේෂය | - | (19,887,113.92) | 1,315,464,107.72 | 4,605,240.63 | 199,332,113.44 | 1,499,514,347.87 |
| ප්‍රවර්තන වර්ෂය තුල ප්‍රධාන ලැබීම් | | | 562,947,852.98 | | | 562,947,852.98 |
| අදායම් සංචිත | | | | 93,094,358.50 | | 93,094,358.50 |
| කලච්චේදය සඳහා අතිරික්තය/(ඌණතාවය) | | (10,284,599.09) | | 1,133,396.87 | | (9,151,202.22) |
| වසර තුල ගෙවීම් | | | | | 106,830,733.83 | 106,830,733.83 |
| **2014/12/01 ශේෂය** | **-** | **(30,171,713.01)** | **1,878,411,960.70** | **98,832,996.00** | **306,162,847.27** | **2,253,236,090.96** |

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. } ඊඑච්/සී/යූඑස්ඩීඒ/එෆ්ඒ/14/01   ඔබේ අංකය / உமது இல. / Your No. }   දිනය / திகதி / Date } 2016 මාර්තු/ දින

සභාපති

නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය

**නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

---

නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියේ 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 2008 අංක 36 දරන නාගරික ජනාවාස සංවර්ධන අධිකාරී පනතේ 17(2) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර අධිකාරියේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් යථා කාලයේදී නිකුත් කරනු ලැබේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

1

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, .- இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை.- No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34   +94-11-2887223   oaggov@sltnet.lk   www.auditorgeneral.gov.lk

## 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදි. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අධිකාරියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2 මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ආයතනයේ අඛණ්ඩ පැවැත්ම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2008 අංක 36 දරන නාගරික ජනාවාස සංවර්ධන අධිකාරය පනතේ 16(3) උප වගන්තියේ දැක්වෙන විධිවිධාන ප්‍රකාරව, අධිකාරියේ ආරම්භක ප්‍රාග්ධනය රු. මිලියන 5,000 ක් විය යුතු අතර එය කොටස් වශයෙන් රජයේ ඒකාබද්ධ අරමුදලින් ගෙවනු ලැබිය යුතු වුවද 2014 වර්ෂය නිම වන විටත් අධිකාරියට කිසිදු ප්‍රාග්ධනයක් සපයා නොතිබුණි.

(ආ) 2008 අංක 36 දරන නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය පනතේ 16 (ඉ) උප වගන්තියේ දැක්වෙන විධිවිධාන ප්‍රකාරව අඩු වියදම් නිවාස වැඩසටහන්වලට මුදල් සැපයීම සඳහා දේපල සංවර්ධනය කරන්නන්ගෙන් සේවා ගාස්තු වශයෙන් නාගරික සංවර්ධන අධිකාරිය විසින් එකතු කරගනු ලබන සියලු මුදල් ජනාවාස සංවර්ධන අධිකාරියේ අරමුදලට බැර කළ යුතු නමුත් 2010 දෙසැම්බර් 14 දිනැති අංක 10/2951/504/012 දරන අමාත්‍ය මණ්ඩල තීරණය අනුව නාගරික සංවර්ධන අධිකාරිය විසින් මෙම සේවා ගාස්තු අයකිරීම නවතා තිබුණු බැවින් නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියට සිය ප්‍රධාන ආදායම් මාර්ගය අහිමි වී තිබුණි. මේ අනුව භාණ්ඩාගාරයේ හෝ රජයේ වෙනත් මූල්‍ය සහයක් නොමැතිව අධිකාරය පවත්වාගෙන යාමේ අවිනිශ්චිත තත්ත්වයක් පවතී.

2.2.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 02 පරිදි සමාලෝචිත වර්ෂයට පෙර වර්ෂයේ වෙනස්වීම් සහිතව සහ සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට පැවති ශුද්ධ වත්කම් හෝ ස්කන්ධයට එකතුවන පරිදි ශුද්ධ වත්කම් / හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය සකස් කර නොතිබුණි. එසේම ප්‍රමිතියට පටහැනිව මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම නොවන බැරකම් යටතේ වර්ග කර ඇති රු.5,738,638 ක් වූ පාරිතෝෂික ප්‍රතිපාදනය සහ රු.306,162,847 ක් වූ ජංගම වගකීම් ශුද්ධ වත්කම් / හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනයේ සංචිත අරමුදල යටතේ සහ විලම්භිත අයභාර ප්‍රදාන යටතේ ඇතුළත් කර තිබුණි.

2.2.3 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2015 ජනවාරි මාසයේදී මිලදී ගෙන තිබූ එකතුව රු.129,900 ක් වූ ගොඩනැගිලි ද්‍රව්‍ය සමාලෝචිත වර්ෂයේ මිලදී ගැනුම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළදී අවලංගු කරන ලද රු.656,410 ක් වටිනා චෙක්පත ගිණුම්ගත නොකිරීම හේතුවෙන් 2014 දෙසැම්බර් 31 දිනට මුදල් ශේෂය සහ ජංගම බැරකම් ශේෂය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) ගෙවියයුතු පුවත්පත් දැන්වීම් ගාස්තු රු.615,776 ක් ගිණුම්ගත කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුළදී ණය පදනම මත ලබාගත් වටිනාකම රු.1,144,718 ක් වූ වායු සමීකරණ යන්ත්‍ර හා උපකරණ ගිණුම්වලින් අත්හැරී තිබුණි.

(ඉ) සහස්පුර හා සිංහපුර නිවාස ව්‍යාපෘතිය

i. යථෝක්ත ව්‍යාපෘතිය අළුත්වැඩියා කිරීම් වෙනුවෙන් 2013 වර්ෂයේදී ජාතික නිවාස සංවර්ධන අධිකාරියෙන් ලැබුණු රු.13,761,694 ක මුදල හා කොන්ත්‍රාත්කරුට ගෙවන ලද රු.13,766,209 ක අත්තිකාරම් මුදල එකිනෙකට හිලව් කර 2013 වර්ෂයේදී ගිණුම්ගත කර තිබීම සමාලෝචිත වර්ෂයේදී ද නිවැරදි නොකිරීම හේතුවෙන් පිළිවෙලින් ජංගම වගකීම් හා ජංගම වත්කම් එම ප්‍රමාණයන්ගෙන් අඩුවෙන් දක්වා තිබුණි.

ii. නිවාස ව්‍යාපෘතියේ අළුත්වැඩියා කිරීම හා විදුලි සෝපාන අළුත්වැඩියා කිරීම වෙනුවෙන් කොන්ත්‍රාත්කරුවන්ට ගෙවන ලද අත්තිකාරම් මුදලින් නොපියවූ පිළිවෙලින් රු.5,085,600 ක් හා රු.1,904,928 ක අත්තිකාරම් ජංගම වත්කම් යටතේ නොපියවූ අත්තිකාරම් යටතේ දැක්වීම වෙනුවට මුදල් වර්ෂයේ වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

iii. නිවාස ව්‍යාපෘතියේ අළුත්වැඩියා කිරීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂය අවසන් දිනට නිවාස සංවර්ධන අධිකාරියෙන් ලැබිය යුතු හා කොන්ත්‍රාත්කරුට ගෙවිය යුතු රු.3,858,048 ක රඳවා ගැනීම් බඳු ගිණුම්ගත කර නොතිබුණි.

(ඊ) 48 වත්ත නිවාස යෝජනා ක්‍රමයේ විකිණීමට ඇති නිවාස 14 ක පිරිවැය සහ ශුද්ධ උපලබ්ධි අගය අතර වෙනස අයහාර සංචිතයක් ලෙස හඳුනාගත යුතු නමුත් එම නිවාස වල පිරිවැය සැළකිල්ලට නොගෙන රු.34,500,000 ක් වූ තක්සේරු වටිනාකම ප්‍රාග්ධන සංචිත ගිණුමකට බැර කර තිබුණි.

(උ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට විකිණීම සඳහා නිමකර තිබූ පිරිවැය රු.1,172,520,527 ක් වූ අඟුලාන නිවාස යෝජනා ක්‍රමයේ නිවාස 288 සාධාරණ අගය හෝ පිරිවැය යන වටිනාකම් වලින් අඩු වටිනාකමට ජංගම වත්කම් යටතේ දැක්විය යුතු වුවද නිවාස පිරිවැය නොනිමි වැඩ ලෙස ජංගම නොවන වත්කම් යටතේ දක්වා තිබුණි.

(ඌ) රජයේ ප්‍රදානයක් ලෙස ලැබී තිබූ පිරිවැය රු.22,450,000 ක් වූ මෝටර් වාහනය සඳහා සමාලෝචිත වර්ෂයට අදාල රු.4,490,000 ක් වූ ක්ෂය ප්‍රතිපාදනය සහ එම වියදමට සමානව හඳුනාගෙන තිබූ විලම්භිත ආදායම මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ දක්වා නොතිබුණි.

(එ) අධිකාරියේ පනත ප්‍රකාරව පිහිටුවනු ලැබූ අරමුදලකට නිවාස ණය වාරික ලැබීම් බැර කළ යුතු නමුත් සමාලෝචිත වර්ෂය තුළදී ලද රු.3,583,819 ක් වූ විසිරි නිවාස ණය වාරික අධිකාරියේ ආදායමට බැර කර තිබුණි.

(ඒ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වූ රු.93,094,359 ක ප්‍රාග්ධන සංචිත ගිණුමේ ශේෂය මූල්‍ය ප්‍රකාශන තුළ අයහාර සංචිත ලෙස දක්වා තිබුණි.

(ඔ) ඉකුත් වර්ෂයට අදාලව සිදුකරන ලද රු.370,000 ක් වූ කුලී ආදායම් අඩුවෙන් ගිණුම්ගත කිරීම, රු.9,900,000 ක් වූ ආදායම් වැඩියෙන් ගිණුම්ගත කිරීම සහ රු.8,184,167 ක් වූ මෝටර් වාහන ක්ෂය අඩුවෙන් වෙන්කිරීම් ලාභාලාභ ගිණුමේ ඉදිරියට ගෙන ආ ශේෂයට ගලපා තිබූ නමුත් අතීතානුයෝගී ලෙස ගිණුම් නැවත සකස් කර නොතිබුණි.

(ඔ) ශුද්ධ වත්කම් / හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශනයේ රජයේ ප්‍රදාන ආරම්භක ශේෂය රු.93,094,359 කින් අඩුවෙන් දක්වා එම ප්‍රමාණයෙන් සමාලෝචිත වර්ෂය තුළ ලැබීම් වැඩියෙන් දක්වා තිබුණි.

(ක) තුරුඉතුරුගම නිවාස ව්‍යාපෘතියේ නිවාස 108 ක් ඉදිකිරීම සඳහා රජයෙන් රු.මිලියන 65 ක ප්‍රදානයක් ලැබී තිබුණද එම ඉදිකිරීම සඳහා රු.85,434,855 ක් වැය වී තිබුණි. රජයේ ප්‍රදානයට අතිරේකව දරන ලද රු.20,434,855 ක මුදල මූල්‍යනය කළ අකාරය පිළිබඳ තොරතුරු මූල්‍ය ප්‍රකාශන මගින් හෙළිදරව් කර නොතිබුණි.

(ග) තුරුඉතුරුගම නිවාස ව්‍යාපෘතියේ සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට විකුණූ නිවාස 99 න් ලැබුණු රු.54,213,472 ක් විලම්භිත ආදායම් ලෙස හා නොවිකුණූ නිවාස 8 ට අදාල රු.4,380,887 ක පිරිවැය රජයේ ප්‍රදාන ලෙස ගිණුම්ගත කරනු වෙනුවට රු.58,594,358 ක් වූ මුළු මුදලම ප්‍රාග්ධන සංචිත ගිණුමට බැර කර තිබුණි. තවද සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ඉතිරි නිවාස 08 හි වටිනාකම ශුද්ධ උපලබ්ධි අගය හෝ පිරිවැය යන වටිනාකමින් අඩු අගයට ගිණුම්ගත කල යුතු වුවත් එය රු.6,328,507 ක් වූ පිරිවැයට ගිණුම්ගත කර තිබුණි.

(ට) රියල් ස්ටේට් එක්ස්චේන්ජ් පුද්ගලික සමාගමේ කටයුතු අවසන් කිරීමෙන් පසු එම සමාගමට අයත් වාහන 05 ක් අධිකාරිය විසින් භාවිතා කරනු ලැබුවද ඒවා අධිකාරියට පවරා ගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

### 2.2.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

එකතුව රු.3,891,912 ක් වූ ණයහිමි ශේෂයක් වසර හතරකට ආසන්න කාලයක සිට නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

### 2.3 නීති , රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

2014 නොවැම්බර් 21 දිනැති අංක 05/2014 දරණ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛය අනුව ලාභ උපයා ඇති ආයතනවල සේවකයන්ට රු.15,000 ක ප්‍රසාද දීමනාවක් ගෙවීමට නිර්දේශ කර තිබුණද අධිකාරිය විසින් සමාලෝචිත වර්ෂයේ දී රු. මිලියන 10 ක ඌනතාවයක් ලබා තිබියදී, එම චක්‍රලේඛය පදනම් කරගෙන අධිකාරියේ සේවකයන් 89 දෙනෙකුට රු.මිලියන 1.3 ක ප්‍රසාද දීමනාවක් පාලක මණ්ඩලයේ අනුමැතිය මත ගෙවා තිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා අධිකාරියේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.10,284,599 ක ඌනතාවයක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.6,032,874 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ රු.16,317,473 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මූල්‍ය ප්‍රතිඵලය පිරිහීම කෙරෙහි සංවර්ධන වියදම් සහ පරිපාලන වියදම් පිළිවෙලින් රු.25,858,349 කින් සහ රු.11,563,032 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) සිංහපුර නිවාස යෝජනා ක්‍රමයේ නිවාස 15 ක් වසර 05 ක කාලයක් සඳහා මාසයකට රු.5,000 බැගින් බදු පදනම මත ලබා දී තිබුණු අතර ගිවිසුම් ප්‍රකාරව නොකඩවා මාස 03 ක කාලයක් බදු කුළී නොගෙවන්නේ නම් ගිවිසුම අවසන් කළ යුතු විය. එහෙත් මාස 5 සිට මාස 24 ක කාලයක් සඳහා බදු කුළී ගෙවා නොමැති නිවාස 10 ක බදු ගිවිසුම අවලංගු කර නොතිබුණු අතර අදාල බදු ලිපිගොනු සහ හිඟ බදු කුළී ලේඛන විධිමත් පරිදි පවත්වා ගෙනගොස් නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළදී පවත්වන ලද ලෝක ජනාවාස දිනය නිමිත්තෙන් "කොළඹ ළමයි" නමින් නාට්‍යයක් සහ විදි-ආහාර ප්‍රවර්ධන වැඩසටහනක් සඳහා රු.23,449,601 ක මුදලක් වැය කර තිබුණු අතර මෙහි ඇඳුම් නිර්මාණ සැරසිලි හා ශබ්ද විකාශන, පුහුණුකරුවන් හා උපකරණ කුලියට ගැනීම සහ ප්‍රචාරණය වෙනුවෙන් මුළු පිරිවැයෙන් සියයට 42 , සියයට 18 , සියයට 17 ක් පිළිවෙලින් වැය කර තිබූ නමුත් වියදමේ ඵලදායිත්වය තහවුරු නොවිය.

(ඇ) අඟුලාන නිවාස යෝජනා ක්‍රමයේ රඳවා ගැනීම් මුදල් රු.45,491,256 ක් ව්‍යාපෘතිය නිමවීමට පෙර බැංකු සුරැකුමක් මත මුදා හැර තිබූ නමුත් එම බැංකු සුරැකුම 2014 නොවැම්බර් 06 දිනදී කල් ඉකුත් වී තිබුණි. තවද ඉන් රු.22,722,883 කට අදාල බැංකු සුරකුම් 2015 සැප්තැම්බර් 30 දින වන විටත් ලබා ගෙන නොතිබුණි.

7

4.2 [illegible] පරිපාලනය

[illegible] වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අධිකාරියේ අනුමත සේවක සංඛ්‍යාව 111 ක් වූ [illegible] සේවක සංඛ්‍යාව 122 ක් වූයෙන් පුරප්පාඩු 04 ක් හා අතිරික්ත සේවක සංඛ්‍යාව 15 [illegible] විය.

5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

5.1 අයවැය පාලනය

රජයේ වාර්ෂික ඇස්තමේන්තු කාර්යයන් සඳහා අයවැය ලේඛනයක් සකස් කර තිබූ නමුත් අධිකාරියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන තථ්‍ය තොරතුරු හා අයවැයගත තොරතුරු අතර විචලනයන් හඳුනාගත හැකි වන පරිදි අයවැය ලේඛනය සකස් කර නොතිබුණි.

6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු පිළිබඳව වරින්වර අධිකාරියේ සභාපතිවරයා දැනුවත් කරන ලදි. පහත දැක්වෙන පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතුවේ.

(අ) ගිණුම්කරණය

(ආ) මූල්‍ය කළමනාකරණය

(ඇ) වාහන උපයෝජනය

(ඈ) කාර්ය මණ්ඩල පරිපාලනය

(ඉ) කොන්ත්‍රාත් පරිපාලනය

එච්.එම්.ගාමිණී විජේසිංහ

විගණකාධිපති